# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2010 ඔක්තෝබර් මස 01 වන දින

II වන කොටස

## අතිරේකය

(2010.10.04 දින නිකුත් කරන ලදී)


# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 41.00 යි. තැපැල් ගාස්තුව : රු. 12.50 යි.

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)

එල්. ඩී.—ඕ. 54 /2007

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 2010 අංක      දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*262 වන අධිකාරියට අලුත් I වන කොටස ඇතුළත් කිරීම.*

2. (මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන) 2004 අංක 14 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ආඥාපනතේ, 3 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් කොටස ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ I වන කොටස ලෙස බලපැවැත්විය යුතු ය :—

### "I වන කොටස

### ජාතික සීමා නිර්ණය කමිටුවක් ස්ථාපිත කිරීම

*ජාතික සීමා නිර්ණය කමිටුවක් ස්ථාපිත කිරීම.*

3අ. (1) අමාත්‍යවරයා විසින් මෙම වගන්තිය ක්‍රියාත්මක වීමේදී ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් පස් දෙනෙකුගෙන් සමන්විත (මේ කොටසේ ජාතික කමිටුව යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික සීමා නිර්ණය කමිටුවක් ස්ථාපිත කරනු ලැබිය යුතු අතර අමාත්‍යවරයා විසින් එකී තැනැත්තන්ගෙන් එක් තැනැත්තකු ජාතික කමිටුවේ සභාපතිවරයා ලෙස නම් කරනු ලැබිය යුතු ය.

(2) ජාතික කමිටුවේ සාමාජිකයන්ගේ ධුර කාලය තුළ එකී සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත් අමාත්‍යවරයා විසින් එකී පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය යුතු ය.

(3) ජාතික කමිටුවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තුන් දෙනෙකු විය යුතු අතර, එකී කමිටුවේ සභාපතිවරයා එකී කමිටුවේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. ජාතික කමිටුවේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරින් සාමාජිකයකු එකී රැස්වීමේ මුලසුන දැරීම සඳහා නම් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ජාතික කමිටුව විසින් එකී කමිටුවේ රැස්වීම් පවත්වාගෙනයාම සහ කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් පටිපාටි විධිමත් කරගනු ලැබිය හැකි ය.

ජාතික කමිටුවේ කාර්යභාරය සහ ඉදිරිපත් කළ යුතු වාර්තා.

3ආ. (1) ජාතික කමිටුවේ කාර්යභාරය වනුයේ යම් පළාත් පාලන ආයතනයක්, (2) වන උපවගන්තියේ දක්වා ඇති නියමයන් සැළකිල්ලට ගනිමින් ඒ ඒ පළාත් පාලන බල ප්‍රදේශ කොට්ඨාශවලට බෙදා වෙන් කිරීම සඳහා අමාත්‍යවරයාට නිර්දේශ කිරීම සහ එසේ නිර්මාණය කරනු ලැබූ එක් එක් ඡන්ද කොට්ඨාශවල සීමා නිර්ණය කිරීමද, එකී එක් එක් කොට්ඨාශවලට නමක් සහ අංකයක් වෙන් කොට දීම ද වේ.

(2) ජාතික කමිටුව විසින් යම් පළාත් පාලන ආයතනයක් වෙන් වෙන් කොට්ඨාශවලට බෙදීම සඳහා තම නිර්දේශ ලබා දීමේ දී පහත සඳහන් කාරණා, එනම් :—

(අ) අදාළ පළාත් පාලන ආයතනයේ බල ප්‍රදේශයේ ජනවාර්ගික ජනගහන අනුපාතය සහ ඒ ඒ ජන කොටස්වලට සමාන නියෝජනයක් ලබා දීමට ඇති අවශ්‍යතාවය ;

(ආ) පළාත් පාලන ආයතනයේ භූගෝලීය ප්‍රදේශය සහ එහි භෞතික ලක්ෂණ ;

(ඇ) පළාත් පාලන ආයතනයේ බල ප්‍රදේශයේ ජනගහනය සහ එහි ජන ඝනත්වය ; සහ

(ඇ) පළාත් පාලන ආයතනයේ ආර්ථික සංවර්ධන මට්ටම,

සැලකිල්ලට ගත යුතු ය.

(3) (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කරන කාරණා සැළකිල්ලට ගනිමින් එක් අපේක්ෂකයකුට වැඩි අපේක්ෂකයන් සංඛ්‍යාවක් තෝරා ගැනීමට හිමිකම ඇති ඡන්ද කොට්ඨාශ නිර්මාණය කිරීම උචිත බව ජාතික කමිටුව අදහස් කරන අවස්ථාවක, යම් පළාත් පාලන ප්‍රදේශයක් සඳහා බහු සභික කොට්ඨාශයන් නිර්මාණය කිරීමට ජාතික කමිටුව විසින් නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(4) ජාතික කමිටුවේ කටයුතු පවත්වාගෙන යාම, නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(5) 3අ වගන්තිය යටතේ ස්ථාපිත කරනු ලබන ජාතික කමිටුවක් විසින්, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන දිනය වන විට තම කාර්යභාරය සම්පූර්ණ කළ යුතු බව නියම කරනු ලැබිය යුතු අතර තම කාර්යභාරය නිමා කිරීමේ දී ඒ පිළිබඳ වාර්තාවක් අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතු ය.

එක් එක් පළාත් ආයතනය සඳහා නිර්මාණය කරනු ලබන එක් එක් ඡන්ද කොට්ඨාශයේ මායිම්, නම් සහ අංක පිළිබඳ නිවේදනය ප්‍රසිද්ධ කළ යුතු බව.

3ඈ. ජාතික කමිටුවේ වාර්තාව ලැබීමෙන් පසු, අමාත්‍යවරයා විසින් ගැසට්පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් පිළිවෙලින් එක් එක් පළාත් පාලන ආයතනය සම්බන්ධයෙන්, ජාතික කමිටුවේ නිර්දේශය මත නිර්මාණය කරනු ලැබූ කොට්ඨාශ සංඛ්‍යාව සහ එසේ නිර්මාණය කරනු ලැබූ එක් එක් කොට්ඨාශයේ මායිම්, සහ වෙන්කොට දෙන ලද නම් සහ අංකයන් ද ජාතික කමිටුව විසින්, බහු සභික කොට්ඨාශයක් නිර්ණය කිරීම නිර්දේශ කරනු ලබන අවස්ථාවක දී, එකී එක් එක් බහු සභික කොට්ඨාශයේ නම සහ අංකය ද අදාළ පළාත් පාලන ආයතයේ නම ද, එකී කොට්ඨාශය වෙනුවෙන් තෝරා යැවිය යුතු සභිකයන් සංඛ්‍යාව ද, ප්‍රසිද්ධ කළ යුතු ය.

අමාත්‍යවරයා විසින් යම් කොට්ඨාශයක මායිම් වෙනස් කරනු ලැබිය හැකි බව.

3ඉ. (1) අමාත්‍යවරයා විසින් යම් පළාත් පාලන ආයතනයක සීමාවන් වෙනස් කළ විටෙක 3ඈ වගන්තිය යටතේ සාදන ලද නිවේදනයේ පළ කරනු ලැබූ පරිදි එකී පළාත් පාලන ආයතනයේ කොට්ඨාශවල මායිම්වල ද වෙනස් කිරීම් සිදු කළ

යුතු ය. තවද, එම වෙනස් කිරීම් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් පස් දෙනකුගෙන් සමන්විත වන කමිටුවක නිර්දේශ මත සිදුකල යුතු අතර, 3ආ වගන්තියේ නිශ්චිතව සඳහන් නියමයන් එසේ සිදු කරනු ලබන වෙනස් කිරීම් සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් මායිම් වෙනස් කරනු ලැබූ කොට්ඨාශයේ අලුත් මායිම් ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එය එකී වෙනස් කිරීම් සිදුකළ ඉක්බිතිවම මේ ආඥා පනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් බලපැවැත්විය යුතු ය.

දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් සීමා නිර්ණය කමිටු ස්ථාපිත කිරීම.

3ඉ. (1) ජාතික කමිටුවට තම කාර්යභාරය ඉටුකිරීමේ දී සහාය වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින්, කමිටුවේ සභාපතිවරයා විය යුතු අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් සහ අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් ද සමන්විත (මෙහි මින්මතු දිස්ත්‍රික් කමිටු යනුවෙන් හඳුන්වනු ලබන) එක් සීමා නිර්ණය කමිටුව බැගින් දිස්ත්‍රික් මට්ටමින් පත්කළ හැකි වන්නේ ය :—

(අ) මැතිවරණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු;

(ආ) එකී දිස්ත්‍රික්කය පිහිටා තිබෙන්නේ යම් පළාත් සභාවක සීමා තුළද, එකී පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යාංශයේ නියෝජිතයකු;

(ඇ) සර්වේ ජෙනරාල් දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු ;

(ඈ) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු ; සහ

(ඉ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන රජයේ නිලධරයකු.

(2) දිස්ත්‍රික් කමිටුවක් විසින්, එකී කමිටුවට ජාතික කමිටුව විසින් පවරනු ලැබිය හැකි කර්තව්‍ය කරගෙන යනු ලැබිය යුතු අතර, එය ජාතික කමිටුවේ විධානය සහ අධීක්ෂණය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) 3අ වගන්තියේ (3) සහ (4) වන උපවගන්තිවල යම් විධිවිධාන දිස්ත්‍රික් කමිටුවල රැස්වීම් පවත්වාගෙන යාම සහ ඒ සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ I වන කොටස 1අ කොටස ලෙස නැවත අංක යෙදීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට ඉක්බිතිවම සඳහන්වන “I වන කොටස” යන ශීර්ෂය වෙනුවට “1අ කොටස” යන ශීර්ෂය මෙයින් ආදේශ කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

“(1) කොමසාරිස්වරයා විසින් නාමිකව හෝ ධූරයෙන් ශ්‍රී ලංකාවේ එක් එක් දිස්ත්‍රික්කය සඳහා දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයා වශයෙන් හෝ එලෙස ක්‍රියා කිරීම සඳහා යෝග්‍ය සහ සුදුසු තැනැත්තකු සහ අවස්ථාවෝචිත පරිදි, දිස්ත්‍රික්කයේ එක් එක් ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා හෝ යම් නිශ්චිත ඡන්ද විමසීම් ප්‍රදේශයක් සඳහා තේරීම්භාර නිලධරයා වශයෙන් හෝ එලෙස ක්‍රියාකිරීම සඳහා වෙනත් එක් තැනැත්තකු සහ එම දිස්ත්‍රික්කයේ සහකාර තේරීම්භාර නිලධරයන් වශයෙන් හෝ එලෙස ක්‍රියාකිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් තැනැත්තන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

“(2) කොමසාරිස්වරයාගේ සාමාන්‍ය අධීක්ෂණය සහ පාලනයට යටත්ව එක් එක් සහකාර තේරීම්භාර නිලධරයා විසින් සහ සහකාර ඡන්ද විමසීම් නිලධරයා විසින්, යම් ඡන්ද විමසීම් නිලධරයකු මත මෙම ආඥාපනත මඟින් ප්‍රදානය කරනු ලැබ ඇති හෝ පනවනු ලැබ ඇති බලතල හෝ කාර්ය, ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.”.

6. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනත මගින් සංශෝධිත, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 7 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් "යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක සාමාන්‍යයෙන් පදිංචිව සිටියාවූ ද" යන වචන වෙනුවට "යම් කොට්ඨාශයක සාමාන්‍යයෙන් පදිංචිව සිටියාවූ ද" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. 1990 අංක 25 දරන පනතින් අවසන්වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය එහි (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එකී උපවගන්තියේ (ඇ) ඡේදයේ :—

(i) (v) (අ) අනුඡේදයේ "1970 නොවැම්බර් 01 වන දිනට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු 6,720 කට නොඅඩු" සහ "1970 නොවැම්බර් මස 18 වන දිනට පෙර ඇතිකරන ලද ධූරයන්" යන වචන වෙනුවට පිළිවෙලින්, "2007 ජූනි මස 01 වන දිනට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු 2,27,280 කට නොඅඩු" සහ "2006 ජනවාරි මස 01 වන දිනට පෙර ඇතිකරන ලද ධූරයන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) (v) (ආ) අනුඡේදයේ "1970 නොවැම්බර් 18 වන දිනයෙන් පසු ඇතිකරන ලද ධූරයන්" යන වචන වෙනුවට "2007 ජනවාරි මස 01 වන දිනයෙන් පසු ඇති කරන ලද ධූරයන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(iii) (vi) (අ) අනුඡේදයේ "1970 නොවැම්බර් 18 වන දිනට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු. 7,200 කට නොඅඩු" යන වචන සහ "1970 නොවැම්බර් මස 18 වන දිනට පෙර ඇති කරන ලද යම් ධූරයක්" යන වචන වෙනුවට පිළිවෙළින් "2009 ජනවාරි මස 01 වන දිනට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු 2,46,300 කට නොඅඩු" සහ "2009 ජනවාරි මස 01 වන දිනට පෙර ඇති කරන ලද යම් ධූරයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(iv) (vi) (ආ) අනුඡේදයේ, "1970 නොවැම්බර් මස 18 වන දිනයෙන් පසු ඇති කරන ලද" යන වචන වෙනුවට "2009 ජනවාරි මස 01 වන දිනයෙන් පසු ඇති කරන ලද" යන වචන ආදේශ කිරීමෙන්.";

(2) එකී උපවගන්තියේ (එ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(එ) මාස දොළහක් ඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමක් මගින් දඬුවම් පැමිණවිය යුතු වරදක් සම්බන්ධයෙන් බන්ධනාගාරගතවී සිටින හෝ පෙරාතුවම වූ අවුරුදු හතක කාලයක් තුළ එවැනි බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් සම්පූර්ණකල හෝ මරණ දඬුවමකට යටත්ව සිටින හෝ මරණ දඬුවම වෙනුවට ප්‍රදානය කරන ලද බන්ධනාගාරගතකිරීමේ දඬුවමක් විඳිමින් සිටින හෝ පෙරාතුවම වූ අවුරුදු හතක කාලය තුළ එවැනි බන්ධනාගාරගතව සිටීමේ දඬුවමක් සම්පූර්ණ කළ ; හෝ"; සහ

(3) එකී උපවගන්තියේ (ඒ) ඡේදයේ අතුරු විධානයේ :—

(i) එහි (i) වන ඡේදයේ, "1970 නොවැම්බර් 18 වන දිනට පෙරාතුව ඇති කරන ලද තනතුරක් සම්බන්ධයෙන් වූ විට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු. 6,720 කට අඩු හෝ" යන වචන වෙනුවට "2007 ජූනි මස 01 වන දිනට පෙරාතුව ඇති කරන ලද තනතුරක් සම්බන්ධයෙන් වූ විට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු. 2,27,280 කට අඩු හෝ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) එහි (ii) වන ඡේදයේ "1970 නොවැම්බර් මස 18 වන දිනට පසුව ඇති කරන ලද" යන වචන වෙනුවට "2007 ජූනි මස 01 දිනට පසුව" යන වචන ආදේශ කිරීමෙන්. ".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) පළාත් පාලන ආයතනයක එක් එක් කොට්ඨාශයක් එම පළාත් පාලන ආයතනයෙහි ඡන්ද විමසීමේ කාර්යය සඳහා ඡන්ද ප්‍රදේශයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.";

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයා විසින් :—

(අ) කොමසාරිස්වරයා විසින් නිකුත් කල හැකි නියෝගයන්ට අනුකූලව පළාත් පාලන ආයතනයේ ඡන්ද ප්‍රදේශය ඡන්ද දිස්ත්‍රික්ක එකක් හෝ වැඩි ගණනකට වෙන් කළ හැකි ය;

(ආ) වෙන්කොට හඳුනාගත හැකි අකුරක් හෝ අකුරු එක් එක් ඡන්ද දිස්ත්‍රික්කය සඳහා වෙන් කළ හැකි ය;

(ඇ) එම එක් එක් ඡන්ද දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් එම දිස්ත්‍රික්කයට අදාළ ඡන්ද පොළ හෝ ඡන්ද පොළවල් පිහිටි යුතු ස්ථානය තීරණය කළ හැකි ය ; සහ

(ඈ) ඉහත (අ),(ආ) සහ (ඇ) ඡේදවල සඳහන් විස්තර ඇතුළත් දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය හැකි ය.

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(2අ) කොමසාරිස්වරයා විසින් අන්‍යාකාරයෙන් විධාන කළහොත් මිස, ඡන්ද ප්‍රදේශයක් ඡන්ද දිස්ත්‍රික්ක සඳහා වෙන් කිරීම, එසේ වෙන් කරනු ලබන අවස්ථාවේ දී එක් එක් ඡන්ද විමසීම් දිස්ත්‍රික්කයෙහි ඡන්දදායකයන්ගේ සංඛ්‍යාව එක් දහස් පන්සියයකට නොවැඩි වන පරිදි විය යුතු ය.".

(2ආ) (2අ) උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ඡන්ද ප්‍රදේශයක් ඡන්ද දිස්ත්‍රික්ක සඳහා වෙන් කිරීම දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයා විසින් අවශ්‍යතාවය අනුව වෙනස් කළ හැකි අතර, එවැනි වෙනස් කිරීමක් සිදු කරනු ලැබූ විට ඔහු විසින් (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් විස්තර නිශ්චිතව දක්වා ඇති සහ එම වෙනස් කිරීම බලාත්මක වන දිනය දක්වා ඇති දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(2ඇ) කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් යෝජිත සංශෝධන, මහජනතාව වෙත දැනුම්දිය යුතු අතර එම යෝජිත සංශෝධනය සම්බන්ධයෙන් නියෝජන ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවෝචිත පරිදි, (2) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ හෝ (3) වන උපවගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමක් (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් විස්තර සම්බන්ධයෙන් කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකි අතර, එය එම දැන්වීමෙහි නිශ්චිතව දැක්විය යුතු ය.”; සහ

(4) එම වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් “එක් ඡන්ද මධ්‍යස්ථානයක් විනා ඊට වැඩි ගණනක් නොතිබිය යුතු ය.” යන වචන වෙනුවට “එක් ඡන්ද මධ්‍යස්ථානයකට නොඅඩු සංඛ්‍යාවක් තිබිය යුතුය.” යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12අ වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 12අ වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

“පළාත් පාලන ආයතනයක හෝ කොට්ඨාශයක පරිපාලන සීමා වෙනස් කිරීම.

12අ. යම් පළාත් පාලන ආයතනයක හෝ පළාත් පාලන ආයතන බෙදා වෙන්කරනු ලැබ ඇති කොට්ඨාශයක පරිපාලන සීමා, එම පළාත් පාලන ආයතනය පිහිටුවා ඇති යම් නීතියක් යටතේ වෙනස් කරනු ලැබූ විට, හෝ අමාත්‍යවරයා විසින් මෙම ආඥාපනතේ 3ඈ වගන්තිය යටතේ වෙනස් කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, එම පරිපාලන සීමා වෙනස් කරනු ලැබූ පළාත් පාලන ආයතනය හෝ කොට්ඨාශයට සහ ඊට අදාළව 12 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම සහිතව, අදාළ විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12ආ වන වගන්තිය, එහි සඳහන් “ඡන්ද හිමි නාම ලේඛනය සහතික කළ යුතු” සහ “ඡන්ද විමසීම් ප්‍රදේශයට අනුරූප වන” යන වචන වෙනුවට පිළිවෙළින්, “එවැනි ඡන්ද විමසීම් ප්‍රදේශයක එක් එක් කොට්ඨාශයක් සඳහා වන ඡන්ද හිමි නාම ලේඛන සහතික කළ යුතු” සහ “එවැනි ඡන්ද විමසීම් ප්‍රදේශයක අදාළ කොට්ඨාශයට අනුරූප වන” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12ඇ වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 12ඇ වන වගන්තිය, “යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක ඡන්ද හිමි නාමලේඛන” යන වචන වෙනුවට “යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක එක් එක් කොට්ඨාශයක ඡන්ද හිමි නාමලේඛනය” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12ඊ වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 12ඊ වන වගන්තිය, “යම් පළාත් පාලන ආයතනයක ඡන්ද විමසීම් ප්‍රදේශයෙහි සීමා කොතරම් වෙනස්කොට තිබේද යත්” යන වචන වෙනුවට, “අවස්ථාවෝචිත පරිදි, යම් පළාත් පාලන ආයතනයක ඡන්ද විමසීම් ප්‍රදේශයෙහි හෝ යම් කොට්ඨාශක සීමා කොතරම් වෙනස්කොට තිබේද යත්” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය, “යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක ඡන්ද හිමි නාමලේඛනය” යන වචන වෙනුවට “යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක කොට්ඨාශවල ඡන්ද හිමි නාමලේඛන” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංහෝධනය කිරීම.

**14.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (1) වන උපවගන්තිය, එහි සඳහන් “ඡන්ද හිමි නාමලේඛනය” යන වචන වෙනුවට “කොට්ඨාශයන්හි ඡන්ද හිමි නාමලේඛන” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධන කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වන පරිදි සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (i) වන උපවගන්තියේ සඳහන් “යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක ඡන්ද හිමි නාමලේඛනය” යන වචන වෙනුවට “යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක කොට්ඨාශවල ඡන්ද හිමි නාමලේඛන” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (5) වන උපවගන්තියේ සඳහන් "ඡන්ද හිමි නාමලේඛනය" සහ "නාමලේඛනයෙහි" යන වචන වෙනුවට පිළිවෙලින් "ඡන්ද හිමි නාමලේඛන" සහ "නාමලේඛනවල" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත්කොට, ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) එකම ඡන්ද විමසීම් ප්‍රදේශයක හෝ වෙනස් ඡන්ද විමසීම් ප්‍රදේශවල කොට්ඨාශන්හි ඡන්ද හිමි නාමලේඛන එකකට වඩා වැඩි ගණනක ; හෝ";

(2) එම වගන්තියේ (3) වන උපවගන්තිය එහි (ආ) ඡේදයේ සඳහන් "ඡන්ද විමසීම් ප්‍රදේශය පිහිටා ඇත්තේ" යන වචන වෙනුවට "කොට්ඨාශය පිහිටා ඇත්තේ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනත මගින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ සඳහන් "යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක ඡන්ද හිමි නාමලේඛනයට" යන වචන වෙනුවට යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක කොට්ඨාශවල ඡන්ද හිමි නාමලේඛනවලට" යන වචන ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය, එම වගන්තියේ "ඡන්ද හිමි නාමලේඛනය හෝ නාමලේඛනය" යන වචන යෙදී ඇති සෑම අවස්ථාවක දී ම "ඡන්ද හිමි නාමලේඛන හෝ නාමලේඛන" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය, එහි "යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක ඡන්ද හිමි නාමලේඛනය" යන වචන වෙනුවට යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක කොට්ඨාශවල ඡන්ද හිමි නාමලේඛන" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** 1987 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය මෙයින් ඉවත්කොට ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"නාමයෝජනා කාලසීමාව පිළිබඳ දැන්වීම.

26. පළාත් පාලන ආයතනයක සභිකයන් තෝරා පත්කර ගනු ලැබීම සඳහා යම් වර්ෂයක් තුළ ඡන්ද විමසීමක් පවත්වනු ලැබීමට නියමිත කවර විටක වුව ද, එම පළාත් පාලන ආයතනයේ ඡන්ද විමසීම් ප්‍රදේශය පිහිටියේ යම් දිස්ත්‍රික්කයක් ඇතුළත ද, ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා විසින් එම ඡන්ද විමසීම් පැවැත්වීමට තමා අදහස් කරන බවට දැන්වීමක් පළ කළ යුතු ය. එම ඡන්ද විමසීම් ප්‍රදේශයේ එක් එක් කොට්ඨාශය තුළ තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල සියලු අපේක්ෂකයන්ගේ නාමයෝජනා පත්‍ර භාරගැනීම සඳහා පත්කරනු ලැබූ සහකාර තේරීම් භාර නිලධරයාගේ නම සහ අදාළ සහකාර තේරීම් භාර නිලධරයා විසින් නාමයෝජනා පත්‍ර භාරගත යුතු ස්ථානය සහ කාර්යාල වේලාව තුළ දී සිය කාර්යාලයේ දී නාම යෝජනා පත්‍ර භාරගනු ලබන (මෙහි මින්මතු "නාමයෝජනා කාලසීමාව"යනුවෙන් සඳහන් කරනු ලබන) කාලසීමාව නිශ්චිතව දැන්වීමේ සඳහන් කළ යුතු ය. එම නාමයෝජනා කාලසීමාව දැන්වීම පළ කරන ලද දිනයට පසුව එළඹෙන දහහතරවන දිනයෙහි ආරම්භ විය යුතු අතර, එදිනට පසුව එළඹෙන දින දවල් දොළහට අවසාන විය යුතු ය. පළාත් පාලන ප්‍රදේශ සම්බන්ධයෙන් අනුමත කරන ලද ලකුණු වෙන්කර, දෙනු ලබන දිනය, වේලාව සහ ස්ථානය දැන්වීමේ නිශ්චිතව සඳහන් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 27අ වගන්තිය සංශෝධනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 27අ වගන්තියේ (3), (4) හා (5) වන උපවගන්ති ඉවත් කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වගන්තිය සංශෝධනය කිරීම.

22. 1990 අංක 25 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඃ

"(1) මේ ආඥාපනත යටතේ පළාත් පාලන ආයතනයක සභිකයකු වශයෙන් තෝරා පත්කරගනු ලැබීම සඳහා සුදුසුකම් ලැබූ යම් තැනැත්තකු යම් පළාත් පාලන ආයතනයක ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් කොට්ඨාශයක් සඳහා අපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, එකී තැනැත්තා පළාත් පාලන ආයතනයක යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක එකකට වැඩි කොට්ඨාශ සංඛ්‍යාවක් සම්බන්ධයෙන් තෝරාපත් කර ගනු ලැබීම සඳහා අපේක්ෂකයකු ලෙස නාම යෝජනා නොකරනු ලැබිය යුතු ය.";

(2) එම වගන්තියේ (1අ) හා (1ආ) උපවගන්ති ඉවත් කිරීමෙන් ;

(3) එකී වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) (මෙහි මින් මතු "ස්වාධීන කණ්ඩායම" ලෙස හඳුන්වනු ලබන), යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන අපේක්ෂකයන් ලෙස තරග කරන යම් තැනැත්තන් කණ්ඩායමක් හෝ විසින්, යම් පළාත් පාලන ආයතනයක සභිකයන් ලෙස තෝරාපත් කර ගනු ලැබීමේ කාර්යය සඳහා මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ ආකෘතියකින්—

(අ) එකී පළාත් පාලන ආයතනයේ කොට්ඨාශ පදනම මත තෝරා පත් කර ගනු ලැබිය යුතු සභිකයින් සංඛ්‍යාවට සමාන විය යුතු වූ ද, එකී පළාත් පාලන ආයතනයේ එක් එක් කොට්ඨාශය සම්බන්ධයෙන් නාම යෝජනා කරනු ලබන්නා වූ ද අපේක්ෂකයන්ගේ නම් ; සහ

(ආ) මේ ආඥාපනතේ 65අ වගන්තිය යටතේ එකී පළාත් පාලන ආයතනයට තෝරා යැවිය යුතු සභිකයන් ඔවුන් අතුරෙන් පත්කර ගැනීම සඳහා, (අ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලැබිය යුතු

අපේක්ෂකයන් ලෙස නාමයෝජනා කරනු ලැබූ මුළු සභිකයන් සංඛ්‍යාවෙන් සියයට තිහකට සමාන වූ අමතර තැනැත්තන්ගේ නම්,

සඳහන් කරමින් එකී පළාත් පාලන ආයතනය සම්බන්ධයෙන් එක් නාමයෝජනා පත්‍රයක් භාරදෙනු ලැබිය හැකි ය :

එසේ වුව ද, (ආ) ඡේදයේ සඳහන් කර ඇති සියයට තිහක ප්‍රතිශතය සංයුක්ත වන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් හා පූර්ණ සංඛ්‍යාවක භාගයක් වන අවස්ථාවක දී, එම ඡේදයේ කාර්යය සඳහා පූර්ණ සංඛ්‍යාව සියයට තිහ සංයුක්ත වන සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතු ය.

තේරීම් භාර නිලධරයා විසින්, ප්‍රායෝගිකව හැකි පහසු ඉක්මණින් තමන් වෙත භාරදෙනු ලැබූ එක් එක් නාමයෝජනා පත්‍රයෙහි පිටපතක් පිළියෙල කොට නාමයෝජනා පත්‍රයේ එකී පිටපත් තම නාම පුවරුව මත ප්‍රදර්ශනය කළ යුතු ය. නාම යෝජනා පත්‍රය පිටපත් දෙකකින් පිළියෙල කළ යුතු අතර එහි දෙවන පිටපත මත "පිටපත" යන්න පැහැදිලිව ලිවිය යුතු ය.".

(4) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(2අ) (1) වන උපවගන්තිය යටතේ සඳහන් නාම යෝජනා පත්‍රයේ—

(අ) පිළිගත් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් වන විට, එකී පක්ෂයේ ලේකම් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා හෝ පක්ෂයේ ලේකම් විසින් නම් කරන ලද නාමයෝජනා පත්‍රයේ නම සඳහන් අපේක්ෂකයකු විසින් ; සහ

(ආ) ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට, එකී කණ්ඩායමේ නායකයා විසින් හෝ භාර දෙනු ලබන නාමයෝජනා පත්‍රයේ, නම් සඳහන් ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් නම් කරන ලද අපේක්ෂකයකු විසින්,

භාර දෙනු ලැබිය යුතු ය.

(2ආ) මේ ආඥාපනතේ යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ භාරදෙනු ලැබූ නාමයෝජනා පත්‍රයේ සඳහන් මුළු අපේක්ෂක සහ අමතර තැනැත්තන් සංඛ්‍යාවෙන් සියයට විසිපහක්, කාන්තාවන් සහ තරුණයන් ගෙන් සමන්විත විය හැකි ය.”; සහ

(2ආ) මේ වගන්තියේ (2ආ) උපවගන්තියේ සඳහන්, සියයට විසිපහ සංයුක්ත වන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ පූර්ණ සංඛ්‍යාවක භාගයක් වන විටෙක, එකී උපවගන්තිවල කාර්යය සඳහා සියයට විසිපහ සංයුක්ත කරනු ලබන සංඛ්‍යාව, එකී පූර්ණ සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතු ය.”.

(5) එකී වගන්තියේ (4) වන උපවගන්තියේ “නාමයෝජනා කරනු ලබන එක් එක් අපේක්ෂකයාගේ ලිඛිත කැමැත්ත” යන වචන වෙනුවට “නාමයෝජනා කරනු ලැබූ එක් එක් අපේක්ෂකයාගේ සහ එක් එක් තැනැත්තාගේ ලිඛිත කැමැත්ත” යන වචන ආදේශ කිරීමෙන් ;

(6) එකී වගන්තියේ (4අ) උපවගන්තියේ “තරුණ අපේක්ෂකයා” යන වචන යෙදෙන සෑම තැනකම එකී වචන වෙනුවට “තරුණයා” යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(7) එකී වගන්තියේ (4අ) උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :

“(4ආ) එක් එක් අපේක්ෂකයා සම්බන්ධයෙන් හා නාමයෝජනා පත්‍රයක නම් දක්වා ඇති එක් එක් තැනැත්තන් සම්බන්ධයෙන් 1975 අංක 1 දරන වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ එකී පනතින් නියම කරනු ලැබූ ආකෘතියට අනුකූල වූ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් එකී නාමයෝජනා පත්‍රය භාරදීමෙන් පසු මාස තුනක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය.”.

**23.** 1987 අංක 24 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය හා (2) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :-

"(1) (අ) යම් ඡන්ද විමසීමක දී සෑම පිළිගත් දේශපාලන පක්ෂයක් විසින්ම, 26 වන වගන්තිය යටතේ දැන්වීම පළ කරන ලද දිනය සහ නාමයෝජනා පත්‍රය භාරදෙනු ලබන දිනය අතර කාලය තුළ සහ කුමන හේතුවක් නිසා වුව ද, නාමයෝජනා කිරීමේ කාලසීමාවේ අවසන් දිනට ඉහතින් ම වූ දින මධ්‍යහන දොළහ පසු නොවී, නාමයෝජනා පත්‍රය ඉදිරිපත් කළ යුතු සහකාර තේරීම් භාර නිලධරයා වෙත -

(i) පිළිගත් දේශපාලන පක්ෂයක් මගින් නාමයෝජනා කරනු ලැබූ එක් එක් අපේක්ෂකයා සහ අමතර තැනැත්තන් සම්බන්ධයෙන් එක් අයකුට රුපියල් පන්දහසක මුදලක් ; සහ

(ii) ස්වාධීන කණ්ඩායමක් මගින් නාමයෝජනා කරනු ලැබූ එක් එක් අපේක්ෂකයා සහ අමතර තැනැත්තන් සම්බන්ධයෙන් එක් අයකුට රුපියල් විසිදහසක මුදලක්,

තැන්පත් කළ යුතු ය.

(ආ) වලංගු මුදලින් විය යුතු තැන්පතුව—

(i) පිළිගත් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් වන විට, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා ; හෝ

(ii) ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට, එකී ස්වාධීන කණ්ඩායමේ නායකයා,

විසින් භාර දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, මෙම වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අපේක්ෂකයකු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන කිසිදු තැන්පතුවක් සහකාර තේරීම්භාර නිලධරයා විසින් භාර නොගත යුතු ය.";

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "තේරීම්භාර නිලධරයා විසින්" යන වචන වෙනුවට "සහකාර තේරීම්භාර නිලධරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) එම වගන්තියේ පැති සටහන වෙනුවට පහත සඳහන් පැති සටහන ආදේශ කිරීමෙන් :-

"අපේක්ෂකයන් වෙනුවෙන් මුදල් තැන්පත් කරනු ලැබිය යුතු බව."

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** 1990 අංක 25 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් "තේරීම් භාර නිලධරයකු වෙත" යන වචන වෙනුවට "සහකාර තේරීම්භාර නිලධරයකු වෙත" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(4) 29 වන වගන්තියේ තැන්පතුවක් තබන ලද්දේ යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකු වෙනුවෙන් ද, එකී අපේක්ෂකයා තෝරා පත්කර ගනු නොලැබූ අවස්ථාවක සහ එම අපේක්ෂකයා විසින් ලබා ගන්නා ලද ඡන්ද සංඛ්‍යාව ඔහු තරග කරන ලද ඡන්ද කොට්ඨාශයේ දෙනු ලැබූ මුළු වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් විස්සෙන් එකක් නොඉක්මවන අවස්ථාවක ඒ අපේක්ෂකයා වෙනුවෙන් තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබූ ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතු ය. එම මුදල් තැන්පත් කරනු ලැබුවේ යම් සහකාර තේරීම්භාර නිලධරයකු වෙත ද, ඒ නිලධරයා විසින් ඒ මුදල තැන්පත් ගිණුමෙන් ඒකාබද්ධ අරමුදලට පැවරිය යුතු අතර, අනෙක් සෑම අවස්ථාවක ම, තැන්පත් මුදල තබනු ලැබූ, අවස්ථාවෝචිත පරිදි, පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම වෙත ඒ මුදල ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මණින් ආපසු දිය යුතු ය:

එසේ වුවද, එම කොට්ඨාශවල තරග කරන පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් එම ඡන්ද කොට්ඨාශයේ දෙන ලද මුළු වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් විස්සෙන් එකකට වඩා අඩු ඡන්ද ප්‍රමාණයක් ගනු ලබා සිටියහොත්, එම පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා ඉදිරිපත් කරන ලද අමතර තැනැත්තන් සම්බන්ධයෙන් තැන්පත් කරන ලද ඇප මුදල රාජසන්තක කරනු ලැබූ ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතු ය. මෙහි ඉහත සඳහන් විධිවිධාන එම ඇප මුදල පැවරීම සම්බන්ධයෙන් අදාල විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

25. 1990 අංක 25 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) "තේරීම්භාර නිලධරයා විසින්" යන වචන වෙනුවට "සහකාර තේරීම්භාර නිලධරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම උපවගන්තියේ (ආආ) සහ (ආආආ) යන ඡේද ඉවත් කිරීමෙන් ; සහ

(ඇ) එම උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කිරීමෙන්.

(2) එම වගන්තියේ (1අ) උපවගන්තියේ සඳහන් "තේරීම්භාර නිලධරයකු" සහ "තේරීම්භාර නිලධරයා" යන වචන සඳහා පිළිවෙලින් "සහකාර තේරීම්භාර නිලධරයකු" සහ "සහකාර තේරීම්භාර නිලධරයා" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(3) අවස්ථාවෝචිත පරිදි, යම් අපේක්ෂකයකු හෝ යම් පිළිගත් දේශපාලන පක්ෂයක් මගින් හෝ ස්වාධීන

කණ්ඩායමක් හෝ විසින් භාරදෙනු ලැබූ නාමයෝජනා පත්‍රයක නම සඳහන් යම් තැනැත්තකු, හෝ -

(අ) ඔහු තරුණයකු වන අවස්ථාවක, තම උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් හෝ උප්පැන්න සහතිකය ලබාගැනීමට නොහැකි විට එකී තරුණයා විසින් තම උපන් දිනය සහතික කරමින් අත්සන් කළ දිවුරුම් පත්‍රයක් හෝ එකී නාමයෝජනා පත්‍රයට ඇමිණීම පැහැර හැරීම; හෝ

(ආ) එකී නාමයෝජනා පත්‍රයේ ඇතුළත් කිරීමට නියම කරනු ලැබූ තම කැමැත්ත එකී නාමයෝජනා පත්‍රය මත සටහන් කිරීමට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත්වන සංශෝධනයේ දක්වා ඇති ආකෘතියට අනුව පිළියෙල කරන ලද දිවුරුම හෝ ප්‍රකාශය එකී නාමයෝජනා පත්‍රයට ඇමිණීම පැහැරහැරීම ;

හේතුවෙන් නුසුදුස්සකු වන බව සොයාගත් අවස්ථාවක, එසේ භාරදෙනු ලැබූ නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප නොකළ යුතු නමුත් මේ උපවගන්තියේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ යම් හේතුවක් නිසාවෙන් නුසුදුස්සකු වන බවට සොයා ගනු ලැබූ එකී අපේක්ෂකයාගේ හෝ තැනැත්තාගේ නම එසේ භාරදෙනු ලැබූ නාමයෝජනා පත්‍රයෙන් ඉවත් කළ යුතු ය. යම් අපේක්ෂකයකුගේ නම නාමයෝජනා පත්‍රයෙන් ඉවත් කළ විටක එකී නාමයෝජනා පත්‍රය භාරදෙනු ලැබූ, අවස්ථාවෝචිත පරිදි, දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින්, එසේ ඉවත්කරනු ලැබූ නම වෙනුවට වෙනත් නමක් ආදේශ කිරීමට ඉන්පසු හිමිකම නොලබන අතර නම ඉවත් කරනු ලැබූ අපේක්ෂකයා හෝ තැනැත්තා සම්බන්ධයෙන් තැන්පත් කළ මුදල, රාජසන්තක විය යුතු වන්නේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

26. 1990 අංක 25 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය එහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තියේ ආදේශ කිරීම මගින් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

"(1) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් වන විට, නාම යෝජනා පත්‍ර භාරගැනීමේ කාලසීමාව ඉකුත්වීමෙන් පසු-

(අ) යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ වෙනුවෙන් නාම යෝජනා පත්‍රයක් විධිමත් ලෙස ලැබී නොමැති විටෙක; හෝ

(ආ) අවස්ථාවෝචිත පරිදි, තමන්ට ලැබුනු නාමයෝජනා පත්‍ර සියල්ලම ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති බව හෝ එකී නාම යෝජනාපත්‍රවල සඳහන් සියලුම අපේක්ෂකයන්ගේ නම් 31 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාර එකී නාමයෝජනා පත්‍රයෙන් ඉවත් කොට ඇති බව,

සහකාර තේරීම්භාර නිලධරයාට පෙනී යන අවස්ථාවක එකී සහකාර තේරීම්භාර නිලධරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, තමන්ට නාම යෝජනා පත්‍ර කිසිවක් නොලැබුනු බව හෝ තමන්ට ලැබුනු නාමයොජනා පත්‍ර සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබූ බව හෝ එකී නාමයෝජනා පත්‍රවල සඳහන් සියලුම අපේක්ෂකයන්ගේ නම් 31 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ එකී නාමයෝජනා පත්‍ර වලින් ඉවත් කරනු ලැබූ බව හෝ අදාළ ප්‍රදේශය පිහිටි දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම්භාර නිලධරයාට සහකාර තේරීම්භාර නිලධරයා විසින් වහාම වාර්තා කළ යුතු අතර ඡන්ද විමසීම් භාර නිලධරයා විසින් එකී වාර්තාව ලැබීමෙන් පසු දින හතකට වැඩි නොවන කාලයක් තුළ නාමයෝජනා පත්‍ර භාරගැනීමේ වැඩිදුර කාලසීමාවන් නියම කරමින් දැන්වීමක් පළ කළ යුතුය. එකී දැන්වීම මගින් (මෙහි මින්මතු දෙවන, නාමයෝජනා පත්‍ර භාරගැනීමේ කාල සීමාව යනුවෙන් හඳුන්වනු ලබන) සහකාර තේරීම්භාර නිලධරයා විසින් තම කාර්යාලයේදී නාමයෝජනා පත්‍ර භාරගන්නා කාලසීමාවව නිශ්චිතව සඳහන් කළ යුතු අතර මේ ආඥා පනතේ අදාළ සියලු විධිවිධාන ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

**27.** 1990 අංක 25 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින් මෙයින් පහත දැක්වෙන ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

"(ආ) නාම යෝජනා පත්‍රය හෝ පත්‍ර ප්‍රතික්ෂේප වීමෙන් පසු හෝ නාම යෝජනා පත්‍රය හෝ පත්‍රවල සඳහන් කොට ඇති නම් 31 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ එහි සඳහන් යම් හේතු නිසාවෙන් ඉවත් කිරීමෙන් පසු, යම් එක් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයන් පමණක් තෝරාපත්කරගනු ලැබීමට ඉදිරිපත්ව සිටින අවස්ථාවක, සහකාර තේරීම්භාර නිලධරයා විසින් ඒ කරුණු කොමසාරිස්වරයාට දැනුම්දිය යුතු ය. කොමසාරිවරයා විසින්, ඉන්පසුව, 28 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් අපේක්ෂකයින් අතුරෙන්, කවර අපේක්ෂකයන් නගරාධිපති සහ උපනගරාධිපති වශයෙන් තේරී පත්ව ඇති බවට ප්‍රකාශ කළ යුතුද යන්න නිශ්චිතව දක්වන ලෙස, අවස්ථාවෝචිත පරිදි, එකී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාට ඇරයුම් කල යුතුය. අවස්ථාවෝචිත පරිදි එකී ලේකම්වරයා හෝ කණ්ඩායමේ නායකයා හෝ විසින් තම තීරණය කොමසාරිස්වරයාට සංදේශනය කිරීමෙන් පසු කොමසාරිස්වරයා විසින් එසේ නිශ්චය කරනු ලැබූ අපේක්ෂකයන් එකී පළාත්පාලන ආයතනයේ පිළිවෙලින් නගරාධිපතිවරයා සහ උපනගරාධිපතිවරයා වශයෙන් තේරී පත්ව ඇති බව ප්‍රකාශයට පත්කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ :-

"(1) ඡන්ද විමසීම් ප්‍රදේශයක එක් එක් කොට්ඨාශය සඳහා නියම කරන ලද නාමයෝජනා කාලසීමාව ඉකුත් වූ විට සහ යම් නාම යෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන් පසු නාම යෝජනා පත්‍රයක හෝ පත්‍රවල සඳහන් නම් ඉවත් කරනු ලැබූ පසු, එහි නිශ්චිතව සඳහන් කොට ඇති හේතු මත 31 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ

ඉවත් කළ විටෙක එකකට වඩා වැඩි පිළිගත් දේශපාලන පක්ෂවල හෝ ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන් ඡන්ද විමසීම සඳහා විධිමත් ලෙස නාමයෝජනා ලැබ සිටින්නේ නම් සහකාර තේරීම්භාර නිලධරයා විසින් වහාම -

(අ) පිළිගත් දේශපාලන පක්ෂයක එක් එක් අපේක්ෂකයකු වෙත එම පක්ෂයේ අනුමත කරන ලද ලකුණ වෙන් කළ යුතු ය ; තව ද

(ආ) ස්වාධීන කණ්ඩායමක එක් එක් අපේක්ෂකයා සම්බන්ධයෙන් යම් අනුමත කරන ලද ලකුණක් සහ එකී ඡන්ද විමසීම තරග කිරීම සඳහා එකකට වඩා වැඩි ස්වාධීන කණ්ඩායම් සිටින විට-

(i) පළමු අවස්ථාවේ දී එසේ තරග කරන ස්වාධීන කණ්ඩායම්වල එකඟත්වයෙන් ; හෝ

(ii) එවැනි එකඟත්වයක් නොවූ විටක, තම පරම අභිමතය අනුව, සහකාර තේරීම්භාර නිලධරයා විසින් තීරණය කරනු ලබන ආකාරයෙන් කුසපත් ඇදීමෙන්, තීරණය කරනු ලබන යම් අනුමත කරන ලද ලකුණක් වෙන් කළ යුතු අතර,

එම ලකුණ අදාළ පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නමට ඉදිරිපසින් ඡන්ද පත්‍රිකාවේ මුද්‍රණය කළ යුතු ය.”.

29. 1990 අංක 25 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීම මගින් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

“(ඇ) ඡන්ද විමසීම පවත්වනු ලබන දිනය, එම දිනය පුර පසළොස්වක පෝය දිනයක් හෝ 1971 අංක 29 දරණ නිවාඩු පනතේ පළමු උපලේඛනයේ සඳහන් රජයේ නිවාඩු දිනයක් නොවිය යුතු අතර, එය හැකි තාක් දුරට සෙනසුරාදා දිනයක් හෝ තේරීම් භාර නිළධරයා විසින්,

කොමසාරිස්වරයාගේ එකඟත්වයෙන් තීරණය කරනු ලබන දිනයක් හෝ දිනයන් විය යුතු අතර, එම දිනය, දැන්වීම් පළ කරනු ලැබූ දින සිට සති පහකට නොඅඩු සහ සති හයකට නොවැඩි දිනයන් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"නාමයෝජනා පත්‍ර ලැබීමෙන් පසු අපේක්ෂකයකු මිය යාම.

39. (1) ඡන්ද විමසීමේ කාර්ය සඳහා ඡන්ද විමසීම කල් තබනු ලැබීම හා ඡන්දය දීම ආරම්භ කිරීම අතර කාලය තුළ යම් පළාත් පාලන ආයතනයක් වෙනුවෙන් තෝරා පත් කර ගැනීම සඳහා වූ අපේක්ෂකයකුගේ මරණය සිදුවීම නොතකා, ඡන්ද විමසීම සඳහා 38 වන වගන්තියේ (1) උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති දිනයේදී ඒ ඡන්ද විමසීම පැවැත්විය යුතු ය.

(2) අපේක්ෂකයකුගේ මරණය සිදුවීමේ හේතුවෙන් යම් පුරප්පාඩුවක් ඇතිවීමේ දී එකී මියගිය අපේක්ෂකයා අයත් වූ, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් හෝ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා හෝ එකී ස්වාධීන කණ්ඩායම භාර දෙනු ලැබූ නාමයෝජනා පත්‍රයේ දෙවන ස්ථානයේ නම සඳහන් තැනැත්තා හෝ විසින්, එකී පුරප්පාඩුව පිරවීම සඳහා මේ ආඥාපනතේ 8 වන වගන්තිය යටතේ සභිකයකු ලෙස තෝරා පත්කරනු ලැබීමට සුදුසුකම් ඇති තැනැත්තකු නම් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 39අ වගන්තිය සංශෝධනය කිරීම.

31. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරණ පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 39අ වගන්තිය එකී වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීම මගින් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එකී උපවගන්තියේ "ඒ ප්‍රදේශයේ ඡන්ද හිමි නාමලේඛනයේ" යන වචන වෙනුවට "එම ප්‍රදේශයේ යම් කොට්ඨාශයක ඡන්ද හිමි නාම ලේඛනයේ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ඇ) කොට්ඨාශයේ අංකය.;"

*ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.*

32. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය එකී වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

"(1) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක එක් එක් ඡන්ද විමසීම් ප්‍රදේශයේ තේරීම් භාර නිලධරයා විසින්:-

(අ) එක් එක් ඡන්ද දිස්ත්‍රික්කයක එක් එක් ඡන්ද පොළක් භාරව කටයුතු කිරීම සඳහා (මෙහි මින්මතු "ඡන්ද ස්ථානාධිපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් පත් කළ යුතු ය ; සහ

(ආ) ඡන්ද පොළක් සම්බන්ධයෙන් ඡන්ද ස්ථානාධිපතිවරයා වශයෙන් එක් තැනැත්තකුට වඩා වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් පත් කර ඇති විට, එම ඡන්ද ස්ථානාධිපතිවරුන්ගෙන් එක් අයෙකු එම ඡන්ද පොළෙහි ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වශයෙන් පත් කළ යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ (1) වන උපවගන්තිය එහි සඳහන් "යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සඳහා තත්කාලයේ බලපවත්නා" යන වචන සහ "ඒ ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා වූ" යන වචන වෙනුවට "යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් ඡන්ද කොට්ඨාශයක් සඳහා තත්කාලයේ බලපවත්නා" සහ "ඒ ඡන්ද කොට්ඨාශය සඳහා වූ" යන වචන ආදේශ කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.*

34. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය, එහි (ඇ) ජේදයේ සඳහන් "ඒ ඡන්ද විමසීම් ප්‍රදේශයේ" යන වචන වෙනුවට "ඒ ඡන්ද කොට්ඨාශයේ" යන වචන ආදේශ කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.*

35. 1987 අංක 24 දරන පනත මඟින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය එහි (1) වන උපවගන්තිය එහි (1) වන උපවගන්තියෙහි (ආ) ජේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ජේදය ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"(ආ) එක් එක් අපේක්ෂකයාගේ නාම යෝජනා පත්‍රයේ සඳහන් පක්ෂවල නම් සිංහල අකාරාදී අනුපිළිවෙලට ද ඒ එක් එක් පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමට වෙන් කර දී ඇති අනුමත කරන ලද ලකුණ ද නිශ්චිතව දැක්වෙන දැන්වීමක් ඡන්ද පොළෙන් පිටත ;"

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

36. 1990 අංක 25 දරන පනතින් අවසන් වරය සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය එහි (අ) ඡේදයේ “එක් එක් කණ්ඩාමේ” යන වචන ඒ වෙනුවට “එකී කණ්ඩායමේ” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වගන්තිය සංශෝධනය කිරීම.

**37.** 2004 අංක 14 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත සඳහන් පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ "පළමුවැන්න" යන සිරස්තලය සහිත ඡේදයේ "මේ ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා දැනට බලපවත්නා ඡන්ද හිමි නාමලේඛනයෙහි" යන වචන වෙනුවට "මේ කොට්ඨාශය සඳහා දැනට බලපවත්නා ඡන්ද හිමි නාමලේඛනය" යන වචන ආදේශ කිරීමෙන්.

(2) එම වගන්තියේ "දෙවැන්න" යන සිරස්තලය සහිත ඡේදයෙහි "මෙම ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා සභිකයන්" යන වචන වෙනුවට "මෙම කොට්ඨාශය සඳහා සභිකයන්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 53අ වගන්තිය සංශෝධනය කිරීම.

38. ප්‍රධාන ප්‍රඥප්තියේ 53අ වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් "ඡන්ද විමසීම් ප්‍රදේශයේ ඡන්ද හිමි නාමලේඛනය" යන වචන වෙනුවට "කොට්ඨාශයේ ඡන්ද හිමි නාමලේඛනය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 59අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

39. ප්‍රධාන ප්‍රඥප්තියේ 59අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"ඡන්ද ගණන් කිරීම.

"59අ. (1) එක් එක් ඡන්ද පොළක ඡන්ද ගණන් කිරීම එක් එක් ඡන්ද පොළෙහි සිදු කළ යුතු ය.

(2) එක් එක් ඡන්ද පොළක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා හෝ එක් ඡන්ද ස්ථානාධිපතිවරයෙකු පමණක් සිටින විට එම ඡන්ද ස්ථානාධිපතිවරයා එම ඡන්ද පොළෙහි ගණන් කිරීමේ නිලධරයා වශයෙන් කටයුතු කළ යුතු අතර, එම ඡන්ද පොළෙහි කාර්ය මණ්ඩලය ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය වශයෙන් කටයුතු කළ යුතු ය.

(3) කොමසාරිස්වරයාගේ පොදු හෝ විශේෂ විධානයන්ට යටත්ව ඡන්ද විමසීම් ප්‍රදේශයක එක් එක් තේරීම්භාර නිලධරයා විසින් 40 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත්කරනු ලැබූ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයන්ගෙන් එක් අයෙකු හෝ එක් ඡන්ද ස්ථානාධිපතිවරයකු පමණක් පත්කර ඇතිවිට එම ඡන්ද ස්ථානාධිපතිවරයා හෝ එම ඡන්ද විමසීම් ප්‍රදේශයේ එක් එක් කොට්ඨාශය සඳහා ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයා වශයෙන් පත්කළ යුතු ය. තේරීම්භාර නිලධරයා විසින් එම අවස්ථාවේදී ම ඔහු විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි සහායකයන් හා ලිපිකරුවන් හා වෙනත් නිලධරයන් යම් සංඛ්‍යාවක්, ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයා හට ඔහුගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් සහාය වීම සඳහා, පත් කරනු ලැබිය හැකි ය.”.

"ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වගන්තිය අලුතින් ඇතුළත් කිරීම.

40. ප්‍රධාන ප්‍රඥප්තියේ 59අ වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 59ආ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු යː-

"ඡන්ද ගණන් කරනු ලබන ස්ථානය වෙනස් කිරීම.

59ආ. (1) 59 වන වගන්තියේ විධිවිධාන නොතකා, ඡන්දය දීම අතරතුර හෝ ඉන්පසුව ඡන්ද පොළෙහි ඇතිවන යම් සිද්ධීන් හෝ බාධාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් හෝ වෙනත් යම් ආරක්ෂක හේතුන් මත එම ඡන්ද පොළෙහි දී ඡන්ද ගණන් නොකළ යුතු බව එම ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයාගේ මතය වන විට, එම ඡන්ද පොළ පිහිටා ඇති ඡන්ද කොට්ඨාශයේ ඡන්දය දීම අධීක්ෂණය කරනු ලබන තේරීම්භාර නිලධරයා විසින් පත්කරනු ලබන සහකාර තේරීම්භාර නිලධරයා වෙත එම කරුණ

දැන්විය යුතු අතර ඉන්පසුව එම සහකාර තේරීම්භාර නිලධරයා විසින් ඡන්ද ගණන් කරනු ලබන අලුත් ස්ථානය තීරණය කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඡන්ද ගණන් කරනු ලබන ස්ථානයක් වෙනස් කිරීමේදී ඡන්ද ගණන් කිරීමට නියමිත අලුත් ස්ථානය සහ ඡන්ද ගණන් කිරීම ආරම්භවීමට නියමිත වේලාව පිළිබඳ ප්‍රමාණවත් දැන්වීමක් එම තේරීම්භාර නිලධරයා විසින් 60 වන වගන්තිය යටතේ පත්කරනු ලබන ගණන් කිරීමේ නියෝජිතයන් වෙත දෙනු ලැබිය යුතු ය.

(3) සහකාර තේරීම්භාර නිලධරයා විසින් තීරණය කරනු ලබන පරිදි අලුත් ස්ථානයෙහි ඡන්ද ගණන් කිරීම ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඡන්ද පොළෙහි කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව සිදු කළ යුතු ය.

(4) අලුත් ස්ථානයෙහි ඡන්ද ගණන් කිරීම අවසන් කිරීමෙන් පසු ගණන් කිරීමේ නිලධරයා විසින් ගණන් කිරීමේ මධ්‍යස්ථානය පවත්වන ස්ථානය වෙනස් කිරීමට අවසර දෙනු ලැබුවේ අවස්ථාවෝචිත පරිදි යම් සිද්ධියක්, බාධාවක් හෝ ආරක්ෂක හේතුවක් නිසාද, එකී සිද්ධිය, බාධාව හෝ ආරක්ෂක හේතුව පිළිබඳ වාර්තාවක් ඡන්ද විමසීම් ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එහි පිටපතක් කොමසාරිස්වරයා වෙත ද ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 60 සහ 61 වන වගන්ති ප්‍රතියෝජනය කිරීම.

41. ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සහ 61 වන වගන්තිය මෙයින් ඉවත්කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් වගන්ති ආදේශ කරනු ලැබේ :-

"ගණන් කිරීමේ නියෝජිතයන් පත් කිරීම.

60. පළාත් පාලන ආයතනයක යම් ඡන්ද කොට්ඨාශයක් සඳහා වන යම් ඡන්ද විමසීමකදී එක් එක් ඡන්ද පොළෙහි ඡන්ද ගණන් කිරීමේ කටයුතුවලට සහභාගීවීම සඳහා (මෙහි මින්මතු " ගණන් කිරීමේ නියෝජිතයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) නියෝජිතයන් දෙදෙනකු පත් කිරීමට

එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයක බලයලත් නියෝජිතයාට හෝ ස්වාධීන කණ්ඩායමක, කණ්ඩායමේ නායකයාට හිමිකම තිබිය යුතු ය. එසේ පත් කරනු ලැබූ නියෝජිතයන්ගේ නම්, ලිපින සහ ජාතික හැඳුනුම්පත් ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර ගණන් කිරීමේ නිලධරයාට ලිඛිතව දිය යුතු ය. අපේක්ෂකයකුට ඡන්දය ගණන් කරන අවස්ථාවේ දී ඡන්ද පොළේ රැඳී සිටිය හැක්කේ ගණන් කිරීමේ නියෝජිතයකු වශයෙන් පමණි.

ගණන් කිරීම කරනු ලබන වේලාව සහ ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කිරීම.

61. (1) එක් එක් ඡන්ද පොළෙහි ගණන් කිරීමේ නිලධරයා විසින්, ඡන්දය දීම අවසන් කළ පසු හැකි ඉක්මණින් ගණන් කිරීමේ නියෝජිතයන් ඉදිරිපිට දී ඡන්ද ගණන් කිරීම සඳහා කටයුතු පිළියෙල කළ යුතු ය.

(2) ගණන් කිරීමේ නිලධරයා විසින්, ඡන්ද ගණන් කිරීම නිමවීමෙන් පසු එකී ගනන් කිරීමෙන් ලත් ප්‍රතිඵලය 59අ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කොට්ඨාශය සඳහා පත්කරනු ලැබූ ගණන් කිරීමේ නිලධරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(3) ඡන්ද විමසීම් ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා විසින් ඡන්ද ගණන් කිරීම ආරම්භ කරනු ලබන වේලාව සහ එවැනි ඡන්ද ගණන් කිරීමක ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කරනු ලබන වේලාව සහ ස්ථානය එම ඡන්ද කොට්ඨාශයේ තරඟ කරන සියලුම අපේක්ෂකයන් වෙතට ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම.

42. 1987 අංක දරන 24 පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය :-

(අ) එහි (ආ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ආ) එය මත එක් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට වඩා වැඩි සංඛ්‍යාවකට ඡන්දය සලකුණු කොට ඇත්නම්";

(ආ) එහි (ඇ) ඡේදය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ඇ) ලකුණු කොට නොමැතිනම් හෝ ඡන්දය ලකුණු කොට ඇත්තේ කවර පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ද යන්න අවිනිශ්චිත වීම හේතුවෙන් අවලංගුවේ නම්";

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(4අ) ඡන්ද ගණන් කිරීමේ නිලධරයකු විසින්, ඡන්ද ගණන් කරනු ලබන වේලාව තුළ පැමිණ සිටින නියොජිතයකු විසින් ඒ වෙනුවෙන් කරනු ලබන ඉල්ලීමක් කිරීම මත (1) වන උපවගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරනු නොලැබූ ඡන්ද පත්‍රිකා නැවත ගණන් කරනු ලැබිය හැකි අතර, එසේ වුව ද, යම් අපේක්ෂකයකු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් එසේ නැවත ගනන් කිරීම සඳහා ඉල්ලීම් කරනු ලැබිය හැකි උපරිම අවස්ථා සංඛ්‍යාව, දෙකක් නොඉක්මවිය යුතු ය.";

(3) එම වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(6) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයකට සහ ස්වාධීන කණ්ඩායමකට දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳව වචනයෙන් මෙන් ම ඉලක්කමෙන් වූ ලිඛිත ප්‍රකාශයක් ගණන් කිරීමේ නිලධරයා විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය. තව ද, එසේ පිළියෙල කරන ලද ප්‍රකාශය ගණන් කිරීමේ නිලධරයා විසින් සහතික කරනු ලැබිය යුතු අතර, ඔහුගේ ලිපිකරුවන් අතුරින් එක් තැනැත්තෙකු විසින් ද පැමිණ සිටින සහ අත්සන් කිරීමට කැමැත්තක් දක්වන ගණන් කිරීමේ නියෝජිතයන් විසින් ද ඊට සාක්ෂි වශයෙන් අත්සන් තබනු ලැබිය යුතු ය."; සහ

(4) එම වගන්තියේ (6අ), (6ඇ) සහ (7) වන උපවගන්ති ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

43. 1987 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය එහි (2) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

"(2) එක් එක් ගණන් කිරීමේ නිලධරයා විසින්, පාවිච්චි නොකරන ලද ඡන්ද පත්‍රිකා, නරක් වූ ඡන්ද පත්‍රිකා, ද්විත්ව ඡන්ද පත්‍රිකා, ඡන්ද හිමි නාමලේඛනයේ ලකුණු කරනු ලැබූ පිටපත්, නිකුත් කරන ලද ඡන්ද පත්‍රිකාවල උපපත්‍රිකා, ද්විත්ව ඡන්ද ලැයිස්තුව, 53අ වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකා නිකුත් නොකරන ලද ඡන්ද දායකයන්ගේ ලැයිස්තුව, ඡන්ද පත්‍රිකා ගිණුම, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ලිඛිත ප්‍රකාශ සහ 62 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඡන්ද ගණන් කිරීම පිළිබඳ වාර්තාව සමඟ (1) වන උපවගන්තියේ සඳහන් මුද්‍රා තබන ලද පැකට්ටුද 59අ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ පත්කරන ලද ඡන්ද කොට්ඨාශය භාරව සිටින ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයාට භාර දිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

44. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයා සභිකයකු වශයෙන් ප්‍රකාශයට පත් කිරීම,

65 (1) 59අ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කොට්ඨාශය භාරව පත් කරනු ලැබූ ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයා විසින්, 64 වන වගන්තියේ සඳහන් ලේඛන ලැබීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් එකී කොට්ඨාශය සඳහා තම අපේක්ෂකයා ලෙස නාමයෝජනාපත්‍රය මඟින් නම් කරනු ලැබූ සහ එකී කොට්ඨාශයේ ඡන්ද සංඛ්‍යාවෙන් වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබා ගත් පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට අයත් වූ අපේක්ෂකයාගේ නම එකී කොට්ඨාශය සඳහා තේරී පත් වූ සභිකයා වශයෙන් ප්‍රකාශයට පත් කළ යුතු ය. තවද ඔහු විසින්, එකී කොට්ඨාශයේ ඡන්ද විමසීමේ දී තරඟ කළ අන් සියලු පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව ද ප්‍රකාශයට පත් කළ යුතු ය.

(2) යම් පිළිගත් දේශපාලන පක්ෂ දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් අතර හෝ යම් ස්වාධීන කණ්ඩායම් දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් අතර සමාන ඡන්ද සංඛ්‍යාවක් ඇති අවස්ථාවක සහ එක් ඡන්දයක් එකතු කිරීම මඟින් එකී පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක නාමයෝජනා කරනු ලැබූ අපේක්ෂකයා තෝරා පත් කර ගනු ලැබීමට හිමිකම් ලැබෙන විටෙක, එකී අමතර ඡන්දය ලබා දිය යුතු පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම නිශ්චය කිරීම ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට ලොතරැයි ඇදීම මඟින් සිදුකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඡන්ද කොට්ඨාශයක් සඳහා තෝරාපත්කර ගන්නා ලද අපේක්ෂකයා සභිකයකු වශයෙන් ප්‍රකාශ යටපත් කරන ලද විටෙක, ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයා විසින් ඔහුගේ සන්තකයේ පවතින 64 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් සියලුම ලේඛන තේරීම්භාර නිලධරයා වෙත භාරදිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 65අ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

45. ප්‍රධාන ප්‍රඥප්තියේ 65අ වන වගන්තිය මෙයින් ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ :-

සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ තේරී පත්වීමට හිමිකම ඇති අපේක්ෂකයන්.

65අ. (1) බහු සභික කොට්ඨාශයක් වනවිට, වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබාගත්, අවස්ථාවෝචිත පරිදි පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයා එකී කොට්ඨාශයට තේරීපත්වූ සභිකයකු ලෙස පළමුව ප්‍රකාශයට පත් කරමින් සහ එකී කොට්ඨාශයේ සභිකයන් ලෙස තෝරාපත් කරගතයුතු ඉතිරි සභිකයන් ඒ ආකාරයෙන් ම ප්‍රකාශයට පත් කරමින්, ඒ කොට්ඨාශයට තේරී පත්වූ සභිකයන් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු අපේක්ෂකයන් සංඛ්‍යාව එකී කොට්ඨාශයේ ඡන්ද විමසීම තරග කළ එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය සහ ස්වාධීන කණ්ඩායම ලබාගත් ඡන්ද සංඛ්‍යාව මත පදනම් විය යුතු ය.

(2) යම් බහු සභික කොට්ඨාශයක ඡන්ද විමසීමකදී කවර හෝ යම් හේතුවක් නිසාවෙන් පිළිගත් තනි දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් පමණක් කරග කරනු ලැබුවේ නම්, එකී බහු සභික කොට්ඨාශයට තේරී පත්වන සභිකයන් ලෙස ප්‍රකාශයට පත්කළ යුතු අපේක්ෂකයන් අවස්ථාවෝචිත පරිදි පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් හෝ ස්වාධීන කණ්ඩායම් නායකයා විසින් අවස්ථාවෝචිත පරිදි එකී පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් භාරදුන් නාමයෝජනා පත්‍රයේ ඇතුලත් වූ අමතර තැනැත්තන්ගේ ලැයිස්තුවේ නම් සඳහන් තැනැත්තන් අතුරෙන් නම් කරනු ලැබිය යුතු ය.

46. ප්‍රධාන ප්‍රඥප්තියේ 65අ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය එකී ප්‍රඥප්තියේ 65ආ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :-

ප්‍රධාන ප්‍රඥප්තියට 65ආ අලුත් වගන්තිය ඇතුලත් කිරීම.

"කිසිදු නියෝජනයක් නොලැබූ ඡන්ද දායකයන් නියෝජනය කිරීම සඳහා තෝරා ගනු ලැබීමට හිමිකම ඇති අපේක්ෂකයන්,

65ආ. (1) ඡන්ද විමසීම් ප්‍රදේශයේ සියලු කොට්ඨාශ සඳහා තෝරාපත් කරගනු ලැබූ සභිකයන් සංඛ්‍යාව පිළිබඳව 65 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කිරීමෙන් පසු අවස්ථාවෝචිත පරිදි මහනගර සභා අඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 4 වන වගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ නිශ්චය කරනු ලබන පරිදි එම පළාත් පාලන ආයතනය සඳහා තෝරා ගනු ලැබිය යුතු සභිකයන්ගේ සංඛ්‍යාව මේ වගන්තියේ මින්මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට බෙදා වෙන්කොට දීම සිදු කළ යුතු ය.

(2) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩයම්වල සියලු අපේක්ෂකයන් ලබාගත් මුළු ඡන්ද සංඛ්‍යාවෙන් -

(අ) 65 වන වගන්තිය යටතේ එක් එක් කොට්ඨාශයට තෝරා පත්කරගනු ලැබූ ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ අපේක්ෂකයන් ලබාගත් ඡන්ද සංඛ්‍යාව ; සහ

(ආ) එකී අපේක්ෂකයන් තරග කළ කොට්ඨාශය තුළ දෙන ලද මුළු වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් විස්සෙන් එකකට වඩා අඩු ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් එක් එක් පිළිගත් දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම් වල අපේක්ෂකයන් ලබාගත් ඡන්ද සංඛ්‍යාව,

අඩු කිරීමෙන් පසු (මේ වගන්තියේ මින්මතු “අවශේෂ අපේක්ෂකයන්” ලෙස හඳුන්වනු ලබන) ඉහත කී සියලු අපේක්ෂකයින් ලැබූ ඡන්ද සංඛ්‍යාව එකතු කළ යුතු ය. එකී එකතුව, පළාත් පාලන ආයතනයේ කොට්ඨාශ කීපයකට තෝරා පත් කරනු ලැබූ සියලු අපේක්ෂකයින් විසින් ලබාගත් මුළු ඡන්ද සංඛ්‍යාව සමග අවශේෂ අපේක්ෂකයන් ලබාගත් ඡන්ද සංඛ්‍යාවේ එකතුවේ ප්‍රතිශතයක් ලෙස ගතයුතු අතර, එකී ප්‍රතිශතය, (1) වන උපවගන්තිය ප්‍රකාර තෝරාගනු ලැබිය යුතු සභිකයන් සංඛ්‍යාව නිශ්චය කිරීමේ උපමානය විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය ප්‍රකාර තෝරා ගනු ලැබිය යුතු සභිකයින් ප්‍රමාණය, (2) වන උපවගන්තිය යටතේ ප්‍රතිශතය තීරණය කිරීමේදී :-

(අ) සියයට තිහ ඉක්මවා යනු ලබන අවස්ථාවකදී, එම පළාත් පාලන ආයතනයේ බල ප්‍රදේශයේ සියලුම කොට්ඨාශ සඳහා තෝරාගනු ලබන සමස්ථ සභිකයින් සංඛ්‍යාවෙන් සියයට තිහක් විය යුතු ය ; නැතිනම්

(ආ) සියයට තිහට අඩුනම් එම පළාත් පාලන ආයතනයේ බල ප්‍රදේශයේ සියලු කොට්ඨාශ සඳහා තෝරාගනු ලබන සමස්ථ සභිකයින් සංඛ්‍යාවේ එකී ප්‍රතිශතයට සමාන ප්‍රමාණය විය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් සියයට තිහක ප්‍රතිශතය සංයුක්ත කරන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වූ විටෙක, මේ උපවගන්තියේ කාර්යය සඳහා එකී සියයට තිහක ප්‍රතිශතය සංයුක්ත කළ යුතු සංඛ්‍යාව එකී පූර්ණ සංඛ්‍යාව ලෙස සැලකිය යුතු ය.

(5) අවශේෂ අපේක්ෂකයින් විසින් ලබාගත් මුළු ඡන්ද සංඛ්‍යාවේ එකතුව එකී උපවගන්තිය යටතේ තේරී පත් වීම සඳහා හිමිකම ඇති සභිකයන්ගේ සංඛ්‍යාවෙන් බෙදීම මගින් (3) වන උපවගන්තිය යටතේ නිශ්චය කරනු ලැබූ පරිදි තෝරා ගනු ලැබිය යුතු සභිකයන් සංඛ්‍යාව, එකී ඡන්ද විමසීමේ දී තරග කළ පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් අතර බෙදා දිය යුතු ය. එකී බෙදීමේ ප්‍රතිඵලය ලෙස ලැබෙන සංඛ්‍යාව (පූර්ණ සංඛ්‍යාවක භාගයක් ගණන් නොගෙන) මේ වගන්තියේ මින් මතු “තීරක අංකය” ලෙස හඳුන්වනු ලැබිය යුතු ය.

(6) ඉන්පසු, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල ඉතිරි අපේක්ෂකයින් ලබාගත් ඡන්ද සංඛ්‍යාවේ එකතුව (1) වන උපවගන්තිය ප්‍රකාර එකී පළාත් පාලන ආයතනයේ සාමාජිකයන් ලෙස අවස්ථාවෝචිත පරිදි එකී පිළිගත් දේශපාලන පක්ෂයෙන් හෝ ස්වාධීන කණ්ඩායමෙන් තෝරාගනු ලැබීමට හිමිකම ඇති තැනැත්තන් සංඛ්‍යාව නිශ්චිතව සොයා ගැනීමේ කාර්ය සඳහා, තීරක අංකයෙන් බෙදිය යුතු ය. මෙකී ක්‍රමයෙන් නිශ්චිතව සොයාගත් සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන විට, මේ උපවගන්තියේ කාර්ය සඳහා අවශ්‍ය සංඛ්‍යාව එකී පූර්ණ සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතුය.

(7) යම් පිළිගත් දේශපාලන පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් හෝ තෝරා ගනු ලැබිය හැකි සභිකයන් සංඛ්‍යාව (5) වන උපවගන්තියේ සඳහන් ක්‍රමය මගින් තහවුරු කර ගනු ලැබීම අවසානයේ දී (3) වන උපවගන්තිය යටතේ තෝරා ගැනීම සඳහා තවත් සභිකයන් සංඛ්‍යාවක් ඉතිරිව ඇති විට, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම් විසින් (6) වන උපවගන්තිය යටතේ ලබාගත් ඉහළම අගය ඇති භාග සංඛ්‍යාව මත පදනම්ව එකී ඉතිරි සභික සංඛ්‍යාව වෙන්කර දිය යුතු ය.

(8) සහකාර තේරීම්භාර නිලධරයා විසින්, (5) වන උපවගන්තිය යටතේ සභිකයකු තෝරාගනු

ලැබීමට හිමිකම ඇති පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්වරයාට හෝ ස්වාධීන කණ්ඩායමක නායකයාට, අවස්ථාවෝචිත පරිදි, එකී පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් තෝරා යවනු ලැබීමට හිමිකම ඇති සභිකයන් සංඛ්‍යාව දැන්විය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි මහනගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ, නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නාමයෝජනා පත්‍රයේ නම් ඇතුළත්වූ තැනැත්තන් අතුරෙන් ඉහතකී සභිකයන් වශයෙන් තේරීපත්විය යුතු තැනැත්තන්ගේ නම්, නම් කරන ලෙසද ඉල්ලා සිටිය යුතුය.

(9) ඉන්පසු, අදාළ ඡන්ද විමසීම් ප්‍රදේශයේ සහකාර තේරීම්භාර නිලධරයා විසින් මේ වගන්තිය යටතේ තෝරා ගනු ලබන අපේක්ෂකයන්ගේ නම් ප්‍රකාශයට පත්කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

47. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"ප්‍රතිඵල පළ කිරීම.

66. (1) යම් පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් 65 වන වගන්තිය යටතේ එක් එක් කොට්ඨාශය සඳහා සභිකයන් වශයෙන් තෝරාපත් කර ගනු ලැබූ අපේක්ෂකයන් සහ 65අ වගන්තිය යටතේ තෝරාගනු ලබන අපේක්ෂකයන් ප්‍රකාශයට පත් කරනු ලැබීමේදී එම පළාත් පාලන ආයතනයෙහි ඡන්ද විමසීම් ප්‍රදේශයේ සහකාර තේරීම් භාර නිලධරයා විසින්:-

(අ) පළාත් පාලන ආයතනයේ සභිකයන් වශයෙන් තෝරාපත් කරගනු ලැබූ හෝ තෝරා ගනු ලබන සියලුම අපේක්ෂකයන්ගේ නම් සඳහන් කරනු ලැබූ දැන්වීමක් පළ කළ යුතු ය ; තව ද

(ආ) ඡන්ද විමසීම් ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් දිස්ත්‍රික්කයකද, ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා මඟින් ප්‍රතිඵලය කොමසාරිස්වරයා වෙත වාර්තා කළ යුතු ය.

(2) ප්‍රතිඵල පිළිබඳ වාර්තාව ලැබුණු පසු කොමසාරිස්වරයා විසින් එම පළාත් පාලන ආයතනයේ සභිකයන් වශයෙන් තෝරාපත් කරගනු ලැබූ අපේක්ෂකයන්ගේ නම් වහාම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.".

**48.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති එම ප්‍රඥප්තියේ 66අ, 66ආ, 66ඇ, 66ඈ, 66ඉ සහ 66ඊ වගන්ති වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය :-

ප්‍රධාන ප්‍රඥප්තියට 66අ, 66ආ, 66ඇ, 66ඈ, 66ඉ සහ 66ඊ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීම.

66අ. (1) යම් පළාත් පාලන ආයතනයක සාමාජිකයකුගේ ධූරය, අවස්ථාවෝචිත පරිදි, මහනගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත, හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යන පනත්වල විධිවිධාන ප්‍රකාරව පුරප්පාඩු වූ අවස්ථාවක එම පළාත් පාලන ආයතනය පිහිටා ඇත්තේ යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක ද එම ප්‍රදේශය සඳහා පත් කරන ලද තේරීම් භාර නිලධරයා විසින් එවැනි පුරප්පාඩුවක් ඇති වන්නේ -

(අ) එම ඡන්ද විමසීම් ප්‍රදේශයේ යම් කොට්ඨාශයක් සඳහා ඡන්දයෙන් තෝරා ගනු ලැබූ යම් සාමාජිකයකු සම්බන්ධයෙන්ද අවස්ථාවෝචිත පරිදි එම සාමාජිකයා අයත්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන්, එම ඡන්ද ප්‍රදේශයේ ඡන්ද කොට්ඨාශයේ ඇතිවන පුරප්පාඩුව පිරවීම සඳහා පළාත් පාලන ආයතනයේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට සුදුසුකම් ඇත්තාවූ වෙනත් යම් තැනැත්තකු නාම යෝජනා කරන ලෙස ඉල්ලා සිටිනු ලැබිය යුතු ය; හෝ

(ආ) මේ ආඥාපනතේ 65අ වගන්තිය යටතේ තෝරාගනු ලැබූ යම් සභිකයකු සම්බන්ධයෙන් වන විට, එම ධූරය හිස් වූ අපේක්ෂකයා පිළිගත් දේශපාලන පක්ෂයකින් ද නැතහොත් ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකු ද යන්න මත පදනම්ව, අවස්ථාවෝචිත පරිදි, එම පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායම් නායකයාගෙන්, එම පුරප්පාඩුව පිරවීම සඳහා, අවස්ථාවෝචිත පරිදි, මහ නගරසභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ, නම්කර ඇති තැනැත්තන් අතරින් එක් අයකු නාමයෝජනා කරන ලෙස ඉල්ලා සිටිය යුතු ය. තව ද එසේ නාමයෝජනා කරනු ලැබීම සඳහා කවර හෝ තැනැත්තකු ඉතිරිව නොමැති විටක එකී පුරප්පාඩුව පිරවීම සඳහා මේ ආඥාපනතේ 8 වන වගන්තිය යටතේ සභිකයකු ලෙස තෝරාපත් කර ගැනීමට සුදුසු තැනැත්තකු නාමයෝජනා කරන ලෙස තේරීම්භාර නිලධරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, එකී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් පළාත්පාලන ආයතනයක සභිකයකුගේ පුරප්පාඩුවක් පිරවීමට තෝරාපත්කරගනු ලැබූ අපේක්ෂකයකු ඔහු අනුප්‍රාප්තකවනු ලැබුයේ කවර සභිකයකු ගේ ධූරයටද, එකී සභිකයාගේ නොගෙවූ ධූරකාලය සඳහා පමණක් ධූර දැරිය යුතු ය.

යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් ඡන්ද ප්‍රමාණයෙන් සියයට පනහකට වැඩියෙන් ලබා ඇති අවස්ථාවක දී නගරාධිපතිවරයා ප්‍රකාශයට පත් කිරීම.

66ආ. (1) යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් එම පළාත් පාලන ආයතනයේ ආසන ප්‍රමාණයෙන් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබාගෙන ඇති අවස්ථාවකදී, කොමසාරිස්වරයා විසින් එම පළාත් පාලන ආයතනයේ සාමාජිකයන් වශයෙන් තේරීපත්ව ඇති අපේක්ෂකයන්ගේ නම් 66 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ප්‍රසිද්ධ කිරීමෙන් පසුව, අවස්ථාවෝචිත පරිදි, එම පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන්, අවස්ථාවෝචිත පරිදි, එම පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ තේරී පත් වූ සමාජිකයින් අතරින් එම පළාත් පාලන ආයතනය සඳහා පිළිවෙලින් නගරාධිපතිවරයකු සහ නියෝජ්‍ය නගරාධිපතිවරයකු ප්‍රකාශයට පත්කරන ලෙස ඉල්ලා සිටිය යුතු ය.

(2) මෙම වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිශ්චය කරන ලද නගරාධිපතිරවයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ ධූරය එම පළාත් පාලන ආයතනයේ නිල කාලසීමාව ඇතුළත හිස්වන අවස්ථාවකදී, කොමසාරිස්වරයා විසින් මෙම වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව අවස්ථාවෝචිත පරිදි එම නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා අයත්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන්, අවස්ථාවෝචිත පරිදි, එම පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ සභිකයන් අතරින් නව නගරාධිපතිවරයා සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා වශයෙන් පත්වන සභිකයා වහාම නිශ්චය කර කොමසාරිස්වරයාට දැනුම් දෙන ලෙස ඉල්ලා සිටිය යුතු ය. එම තීරණය ලැබීමෙන් පසුව, එම පළාත් පාලන ආයතනයේ අවස්ථාවෝචිත පරිදි නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා වශයෙන් සඳහන් කර ඇති සභිකයාගේ නම කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතු ය.

(3) මෙම වගන්තියේ (2) වන උපවගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන් වුවද, එය නොතකා, අවස්ථාවෝචිත පරිදි මහ නගර සභා ආඥාපනතේ 215අ වගන්තිය යටතේ හෝ නගර සභා ආඥාපනතේ 178 අ වගන්තිය යටතේ හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 169 වන වගන්තිය යටතේ නගරාධිපතිවරයාගේ ධූරයෙහි පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවකදී, සහ එම උපවගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටිය ප්‍රකාරව එම පුරප්පාඩුව පුරවනු ලැබ ඇති අවස්ථාවකදී සහ ඉහතකී ඕනෑම වගන්තියක් යටතේ එකී යම් පුරප්පාඩුවක් පිරවීම සඳහා එසේ පත්කරගනු ලැබූ යම් නගරාධිපතිවරයකු සිය ධූරයෙන් ඉල්ලා අස්වූ ලෙස සළකනු ලබන විටෙක එසේ ඇතිවන පුරප්පාඩුවක් මෙම වගන්තියේ (2) වන උප වගන්තියෙහි නිශ්චිතව සඳහන් කාර්ය පටිපාටිය අනුව පුරවනු නොලැබිය යුතුය. එවැනි අවස්ථාවකදී එසේ දෙවනවරට නගරාධිපතිවරයකුගේ පුරප්පාඩුවක් ඇතිවී ඇති යම් පළාත් පාලන ආයතනයක් විසුරුවා හරින ලද පළාත් පාලන ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එකී පළාත්පාලන ආයතනයේ සභිකයන්ගේ ඉතිරි ධූර කාලය සඳහා ධූර දැරීමට අමාත්‍යවරයා විසින් අදාල පළාත් පාලන ආයතනය සඳහා කොමසාරිස්වරයකු පත්කරනු ලැබිය යුතු ය.

පළාත් පාලන ආයතනයේ පළමු රැස්වීම.

66ඇ. (1) යම් පළාත් පාලන ආයතනයක සමස්ථ ආයතන සංඛ්‍යාවෙන් සියයට පනහකට වඩා අඩු ප්‍රමාණයක් යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ යම් ස්වාධීන කණ්ඩායමක් විසින් ලබාගෙන ඇති අවස්ථාවකදී, එකී පළාත් පාලන ආයතනයේ පළමු රැස්වීමේදී එම පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා තෝරාපත්කරගනු ලැබිය යුතු ය.

(2) පළාත් පාලන කොමසාරිස්වරයා 66 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පළාත් පාලන ආයතනයක සභිකයන් වශයෙන් තේරී පත් වී ඇති අපේක්ෂකයන්ගේ නම් පළ කොට සතියක් ඇතුළත සභාවේ පළමු රැස්වීම ඒ සම්බන්ධයෙන් පළ කරනු ලබන දැන්වීමක් මඟින් කැඳවිය යුතු ය.

එවැනි දැන්වීමක් රැස්වීම සඳහා නියම කරනු ලබන දිනට දින හතකට වඩා අඩු නොවන කාලයකට පෙර එකී දැන්වීම භාර දීම සිදු කළ යුතු අතර -

(අ) භාෂා තුනෙන් ම ගැසට් පත්‍රයේ හා පුවත්පත්වල පළ කළ යුතු ය ; තව ද

(ආ) එම සභාවේ එක් එක් සභිකයාට ලියාපදිංචි තැපෑලෙන් යැවීම කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පළ කරනු ලබන සෑම දැන්වීමක ම පළමු රැස්වීමේ දිනය, වේලාව, සහ ස්ථානය නිශ්චිතව දැක්විය යුතු අතර, එසේ නිශ්චිතව දැක්විය යුතු දිනය, සභාවේ සභිකයන් තෝරා පත් කරගනු ලැබීම හෝ නම් කිරීම සම්පූර්ණ කරන ලද දිනට පසුව එළඹෙන එක් මාසයක කාලය ඇතුළත කල් ඉකුත් වීම මත හැර සභාවේ ධූර කාලය ආරම්භ කිරීම සඳහා හෝ තෝරා පත් කරගනු ලැබූ සභාවක් සම්බන්ධයෙන් වනවිට ධූරය හැර යන සභාවේ අනුප්‍රාප්තිකයා වශයෙන් ධූර කාලය ආරම්භ කිරීම සඳහා නියම කර ඇති දිනයට පසුව එළඹෙන එක් මාසයක කාලය ඇතුළත දිනයක් විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමේ සඳහන් දිනයේ දී යම් හේතුවක් මත රැස්වීම පවත්වනු නොලැබූ අවස්ථාවක, පළාත් පාලන කොමසාරිස්වරයා විසින් අවශ්‍ය විය හැකි පරිදි තවදුරටත් පළ කරනු ලබන දැන්වීමක් හෝ දැන්වීම් මඟින් වෙනත් යම් දිනයක දී රැස්වීම කැඳවිය හැකි නමුත් එම වෙනත් දිනය (2) වන උපවගන්තිය යටතේ පළකර ඇති දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති දිනයට පසුව එළඹෙන එක් මසක් ඇතුළත දිනයක් විය යුතු ය.

පළාත් පාලන ආයතනයක පළමු රැස්වීමේදී හෝ වෙනත් යම් රැස්වීමකදී නගරාධිපති සහ නියෝජ්‍ය නගරාධිපති තෝරාපත් කර ගැනීමේ කාර්ය පටිපාටිය.

66ඈ. (1) 66ඇ වගන්තිය යටතේ කැඳවනු ලබන පළමු රැස්වීම සහ නගරාධිපතිවරයා තෝරා පත් කර ගනු ලබන තෙක් කැඳවනු ලැබිය හැකි වෙනත් යම් රැස්වීමක මුලසුන (මෙම වගන්තියේ "මුලසුන දරන නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් පාලන කොමසාරිස්වරයා විසින් දැරිය යුතු ය.

(2) සභාවේ සභිකයන් එහි පළමු රැස්වීමේ දී තම සභිකයන්ගෙන් එක් තැනැත්තකු එම සභාවේ නගරාධිපතිවරයා වශයෙන් තෝරා පත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සභාවේ නගරාධිපතිවරයා තෝරා පත් කර ගැනීම එම සභාවේ සාමාජිකත්වයෙන් අඩකට වඩා අඩු නොවන සභිකයන් සංඛාවෙන් සමන්විත ගණපූරණයක් එම රැස්වීම සඳහා ඇත්තේනම් මිස සිදු නොවිය යුතු ය.

(4) සභාවේ යම් ඕනෑම සභිකයකු ඔහුගේ කැමැත්ත ඇතිව එම රැස්වීමට පැමිණ සිටින අනෙකුත් සභිකයන් විසින් නගරාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගැනීම සඳහා යෝජනා කොට ස්ථිර කළ හැකි ය.

(5) එක් සභිකයකුගේ නම පමණක් නගරාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගැනීම සඳහා යෝජනා කොට ස්ථිර කරනු ලැබ ඇති අවස්ථාවක, එම තෝරා පත් කර ගැනීම සිදුවන අවස්ථාවේ රැස්වීමේ මුලසුන දරන නිලධරයා විසින් එම තෝරා පත් කරගනු ලැබූ සභිකයා නගරාධිපතිවරයා වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(6) සභිකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවකගේ නම් නගරාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගැනීම සඳහා යෝජනා කොට ස්ථිර කරනු ලැබූ අවස්ථාවක, තෝරා පත් කර ගැනීමේ ක්‍රමය, පැමිණ සිටින සාමාජිකයන් විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කරනු ලබන විවෘත හෝ රහස්‍ය ඡන්දයක් මඟින් විය යුතු ය. එවැනි යෝජනා

සම්මතයක් මත පාවිච්චි කරනු ලබන ඡන්ද සංඛ්‍යාව සමානව බෙදී ඇත්නම් තෝරාපත් කර ගැනීමේ ක්‍රමය නිශ්චය කිරීම මුලසුන දරන නිලධරයා ඉදිරියේ ඔහු විසින් නියම කරනු ලබන ආකාරයට කුසපත් ඇදීමෙන් සිදු විය යුතු ය.

(7) නගරාධිපතිවරයා තෝරා පත් කර ගැනීම විවෘත ඡන්දයක් මඟින් සිදු කළ යුතු බවට (6) වන උපවගන්තිය යටතේ තීරණය කරනු ලැබූ අවස්ථාවක, මුලසුන දරන නිලධරයා පැමිණ සිටින එක් එක් සභිකයාගේ නම අඬ ගැසීමෙන් ඡන්දය දීම පිළිබඳ ඔහුගේ කැමැත්ත විමසා එම කැමැත්ත ඒ ආකාරයට වාර්තා කිරීම මඟින් ඡන්දය ලබාගත යුතු යී යම් සභිකයකු ඡන්දය දීමෙන් වැළකී සිටිනු ලබන අවස්ථාවක මුලසුන දරන නිලධරයා එම සභිකයා ඡන්දය දීමෙන් වැළකී සිටීමේ කරුණ වාර්තාගත කළ යුතු ය.

(8) නගරාධිපතිවරයා තෝරා පත් කර ගැනීම රහස්‍ය ඡන්දයෙන් සිදු කළ යුතු බවට (6) වන උපවගන්තිය යටතේ තීරණය කරනු ලැබූ අවස්ථාවක, තෝරාපත් කර ගැනීම ඡන්ද පත්‍රිකා මඟින් විය යුතු ය.

(9) නගරාධිපතිවරයකු තෝරා පත් කර ගැනීමේ ක්‍රියා පිළිවෙල අවසානයේ දී, මුලසුන දරන නිලධරයා විසින් ඡන්දයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ යුතු ය.

අවශ්‍ය ඡන්ද සංඛ්‍යාව කිසිදු සභිකයකු විසින් ලබා නොගත් විට.

66ඉ. (1) නගරාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගැනීම සඳහා සභිකයන් දෙදෙනෙකුට වඩා යෝජනා කොට ස්ථිර කරනු ලැබ ඇති විට, සහ පළමු ඡන්ද විමසීමේ දී අවශේෂ සභිකයන්ට ලැබී ඇති මුළු ඡන්ද සංඛ්‍යාවට වඩා වැඩි ඡන්ද සංඛ්‍යාවක් කිසිදු එක් සභිකයකු ලබා නොගත් අවස්ථාවක, මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති පරිදි එක් සභිකයකු ඡන්ද විමසීමෙන් ඉවත් කල යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, ඡන්ද විමසීමේ දී අවශේෂ සභිකයන් ලබා ගත් මුළු ඡන්ද සංඛ්‍යාවට වඩා වැඩි ඡන්ද සංඛ්‍යාවක් යම් සභිකයකු විසින් ලබාගන්නා

තෙක් එක් එක් ඡන්ද විමසීමෙන් පසුව එක් සභිකයකු ඉවත් කරනු ලබමින් හෝ ඡන්ද විමසීම සභිකයන් දෙදෙනකු සම්බන්ධයෙන් පමණක් පවත්වා අවසන් කරනු ලබන තෙක්, ඡන්ද විමසීම මේ ආකාරයෙන් ම පවත්වාගෙන යා යුතු ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි සභිකයකු තෝරා පත්කර ගැනීමෙන් ඉවත් කල හැකි ආකාරය පහත සඳහන් පරිදි විය යුතුය :-

(අ) එක් සභිකයකු විසින් ලබාගත් ඡන්ද සංඛ්‍යාව එක් එක් අවශේෂ සභිකයන් විසින් ලබාගත් ඡන්ද සංඛ්‍යාවට වඩා අඩුනම් එම අඩුම ඡන්ද සංඛ්‍යාව ලැබූ සභිකයා ඉවත් කළ යුතු ය; තව ද

(ආ) සියලුම සභිකයන්ගෙන් එක් එක් සභිකයකු සමාන ඡන්ද සංඛ්‍යාවක් ලබාගත්තේ නම් හෝ සභිකයන් දෙදෙනෙකු හෝ ඊට වඩා වැඩි සභිකයන්ගෙන් එක් එක් සභිකයකු සමාන ඡන්ද සංඛ්‍යාවක් ලබාගත්තේ නම් සහ එම ඡන්ද සංඛ්‍යාව අවශේෂ සභිකයාට හෝ එක් එක් අවශේෂ සභිකයන් ලබාගත් ඡන්ද සංඛ්‍යාවට වඩා අඩුවන විට සමාන ඡන්ද සංඛ්‍යාවක් ලබාගන්නා සභිකයන්ගෙන් එක් අපේක්ෂ සභිකයකු ඉවත් කළ යුතු අතර, සභිකයන්ගෙන් ඉවත් කළ යුතු සභිකයා නිශ්චය කිරීම මුලසුන දරන නිලධරයා ඉදිරියේ ඔහු විසින් නිශ්චය කළ යුතු ආකාරයට කුසපත් ඇදීමෙන් සිදුකළ යුතු ය.

(3) යම් ඡන්ද විමසීමක දී සභිකයන් දෙදෙනෙකු සිටි අවස්ථාවක, දෙන ලද ඡන්ද සංඛ්‍යාව සමානව බෙදී යන විට සහ එක් ඡන්දයක් එකතු කිරීම මගින් නගරාධිපතිවරයා වශයෙන් තෝරාපත් වීම සඳහා එක් සභිකයකුට හිමිකම ලැබෙන අවස්ථාවක, එම අතිරේක ඡන්දය දෙනු ලැබූ බවට සැලකිය යුතු සභිකයා තීරණය කිරීම

මුලසුන දරන නිලධරයා ඉදිරියේ, ඔහු විසින්, නිශ්චය කරනු ලැබිය යුතු ආකාරයට කුසපත් ඇදීමෙන් සිදු කළ යුතුය.

නියෝජ්‍ය නගරාධිපතිවරයා තෝරා පත් කර ගැනීම.

66ඊ. (1) පළාත් පාලන ආයතනයක ප්‍රථම නියෝජ්‍ය නගරාධිපතිවරයා අභිනවයෙන් තෝරාපත්කර ගන්නා ලද නගරාධිපතිවරයා මූලාසනය දරන සභාවේ ප්‍රථම රැස්වීමේදී 66ඇ වගන්තිය යටතේ තෝරා පත් කළ යුතු ය.

(2) 66ඇ සහ 66ඈ වගන්ති වල විධිවිධාන නගරාධිපතිවරයාට අදාළ වනවා සේම නියෝජ්‍ය නගරාධිපතිවරයාට ද අදාළ විය යුතු අතර ඒ අනුව එම වගන්තියේ "නගරාධිපතිවරයා" වශයෙන් සඳහන් කරනු ලැබ ඇති සෑම සඳහනක්ම නියෝජ්‍ය නගරාධිපතිවරයා සම්බන්ධයෙන් ද අදාළ කරගත යුතු ය.

නගරාධිපතිධූරය හෝ නියෝජ්‍ය නගරාධිපතිධූරය හිස් වීම.

66උ. සභාවක නගරාධිපතිවරයාගේ හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ ධූරය එම සභාවේ නිලකාලය තුළ දී හිස්වන ඕනෑම අවස්ථාවක දී, පළාත් පාලන කොමසාරිස්වරයා 66ඇ වගන්තියේ (2) වන හෝ (4) වන උපවගන්ති වල විධිවිධාන වලට අනුකූලව භාරදෙනු ලබන දැන්වීමක් හෝ දැන්වීම් මගින් එවැනි හිස්වීමක් පිළිබඳ ඔහුවෙත දැන්වීමෙන් සති දෙකක් ඇතුළත, අවස්ථාවෝචිත පරිදි, අලුත් නගරාධිපතිවරයෙකු හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයකු තෝරාපත් කර ගැනීම සඳහා රැස්වීමක් කැඳවිය යුතු අතර, එවැනි දැන්වීමක හෝ දැන්වීම් වල නියම කරනු ලබන දිනය එම පුරප්පාඩුව ඇති වූ දින සිට ඊලගට එලඹෙන සති හයක කාලය ඇතුලත, අවස්ථාවෝචිත පරිදි, අලුත් නගරාධිපතිවරයෙකු හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයකු තෝරා පත්කර ගනු ලබන බවට තහවුරු කරනු ලබන දිනයක් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම.

**49.** ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) තේරීම්භාර නිලධරයා විසින් සියලුම ඡන්ද පත්‍රිකා, එක් එක් අපේක්ෂකයා වෙත ලබාදෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ප්‍රකාශය, ඡන්ද පත්‍රිකා ගිණුම, ද්විත්ව ඡන්ද ලයිස්තුව, උපපත්‍රිකා පැකැට්ටුව සහ 64 වන වගන්තිය යටතේ ගණන්කිරීමේ නිලධරයන් විසින් එවනු ලබන ඡන්ද හිමි නාමලේඛණ වල ලකුණු කරන ලද පිටපත් එම එක් එක් පැකැට්ටුව මත ඒවායේ ඇතුලත් දේ පිළිබඳ විස්තරයක් සහ ඒවා අදාල වන ඡන්ද විමසීමේ දිනය, සහ ඡන්ද විමසීම පවත්වනු ලැබූ කොට්ටාශ වල නම් පිටසන් කරනු ලබමින් ඡන්ද විමසීම් ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් දිස්ත්‍රික්කයක ද, ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය ඉවත් කිරීම.

**50.** ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 69අ වන වගන්තිය ඉවත් කිරීම.

**51.** ප්‍රධාන ප්‍රඥප්තියේ 69අ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 72අ වන වගන්තිය ඇතුළත් කිරීම.

**52.** ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුලත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 72අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :-

"ඡන්ද පොළවලදී බාධා කිරීම.

72අ. (1) (අ) ඡන්ද දීම ආරම්භ කිරීම සඳහා වන නියමිත වේලාවේදී ඡන්ද පොළක ඡන්දය දීම ආරම්භ කිරීමට නොහැකි වීම ;

(ආ) එවැනි ඡන්දපොළක ඡන්දය දීම විවෘත කිරීමට නියමිත වේලාවේ දී ඡන්දය දීම ආරම්භ කළ ද ඡන්දය දීම අවසන් කිරීමේ නියමිත වේලාව වනතුරු එය අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි වීම ;

(ඇ) ඡන්ද ස්ථානාධිපතිවරයාගේ පාලනයෙන් බැහැර කිසියම් හේතුවක් නිසා එම ඡන්ද පොළේ දී ඡන්දය දීම පැවැත්වීමට නොහැකි වීම ;

(ඈ) ඡන්දය දීමක දී බාධා කිරීමක් සිදුවන අවස්ථාවක ඡන්ද ස්ථාන නියෝජිතයන් එක් අයෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවකට තර්ජනය කිරීම, මරණයට පත්කිරීම හෝ ඡන්දපොළෙන් පිටතට පළවා හැරීම ;

(ඉ) මාර්ගයේ යම් අවහිරතාවයක් නිසා ඡන්දපොළ කාර්ය මණ්ඩලයට ඡන්දපොළට පැමිනීමට නොහැකි වීම ;

(ඊ) ඡන්ද පොළේ දී සාමයට බාධාවන යම් සිදුවීමක් නිසා ඒ ඡන්ද පොළේ දී ඡන්දය පැවැත්වීම අපහසු වීම ;

(උ) කිසියම් තැනැත්තකු විසින් බලහත්කාරයෙන් ඡන්ද පත්‍රිකා ඡන්ද පෙට්ටි තුළට දැමීම ;

(ඌ) කිසියම් ඡන්දපොළක සැබෑ, නිදහස්, සාධාරණ සහ රහස් ඡන්දය දීමක් නොමැති වීම,

යන ස්වභාවයේ වූ ඇතැම් සිදුවීම් එම ඡන්ද පොළෙහි සිදු වූ අවස්ථාවක ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් වහාම තේරීම්භාර නිලධරයා වෙත දැනුම් දිය යුතු අතර, එවිට ඔහු විසින් එම සිද්ධිය කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතු ය.

(2) කොමසාරිස්වරයා විසින් (2) වන උපවගන්තිය යටතේ යම් තොරතුරක් ලැබීම මත සහ එම තොරතුරෙහි නිරවද්‍යභාවය නිශ්චය කිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් විමසීම් සිදු කිරීමෙන් පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් එම ඡන්ද පොළෙහි ඡන්දය දීම අවලංගු බවට ප්‍රකාශයට පත් කළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**53.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

”අපේක්ෂකයකුට තමාගේම ඡන්ද ස්ථාන නියෝජිතයා හෝ ගණන් කිරීමේ නියෝජිතයා වශයෙන් ක්‍රියා කළ හැකිය; නැතහොත් එවැනි නියෝජිතයකුට සහය විය හැකිය.

73. මෙම ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක් සඳහා තොරාපත්කර ගනු ලැබූ අපේක්ෂකයකු වෙනුවෙන් ගණන්කිරීමේ නියෝජිතයකු පත්කරනු ලැබුවේ නම්, එකී නියෝජිතයාට ඉටුකිරීම සඳහා නියම කරනු ලැබිය හැකි යම් ක්‍රියාවක් හෝ දෙයක්, එකී අපේක්ෂකයාට තමා වෙනුවෙන් ඉටු කිරීමට හෝ එවැනි යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කරනු ලබන යම් නියෝජිතයකුට සහය වීම හෝ සිදුකළ හැකි ය. එසේ වුව ද, මෙම වගන්තිය යටතේ ක්‍රියා කිරීමට පෙර එවැනි යම් නියෝජිතයකු විසින් ලබාදිය යුතු යයි නියම කරනු ලබන ප්‍රකාශය අපේක්ෂකයා විසින් ලබාදිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**54.** ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කරනු ලැබේ :-

”අපේක්ෂකයන්ගේ නියෝජිතයන් පැමිණ නොසිටීම.

74. මෙම ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමකදී අපේක්ෂකයාගේ නියෝජිතයා හෝ නියෝජිතයන් ඉදිරියේ දී කරන ලෙස මේ ආඥාපනත යටතේ නියම කරනු ලැබූ හෝ බලය දෙනු ලැබූ යම් ක්‍රියාවක් හෝ දෙයක් කරනු ලබන අවස්ථාවේදී, එම නියෝජිතයා හෝ නියෝජිතයන් ඒ කාර්යය සඳහා නියම කරනු ලැබූ වේලාවට සහ ස්ථානයට පැමිණ නොසිටිය ද එම ක්‍රියාව හෝ දෙය අන්‍යාකාරයකින් යථාපරිදි කර ඇත්නම් එම ක්‍රියාව හෝ දෙය අවලංගු නොවිය යුතු ය”.

**55.** ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ඡන්දය හෙළිදරව් කිරීම තහනම් බව.

75. මෙම ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමකදී ඡන්දය දුන් කිසිම තැනැත්තෙකුට තමා ඡන්දය දුන්නේ කා සඳහා ද යන වග ප්‍රකාශ කරන ලෙස ඒ ඡන්ද විමසීම ප්‍රශ්න කෙරෙන යම් නඩු කටයුත්තක දී නියම නොකළ යුතු ය.".

**56.** ප්‍රධාන ප්‍රඥප්තියේ 75අ වන වගන්තියේ (ආ) ඡේදයේ "වැඩිම මනාප සංඛ්‍යාව" යන වචන වෙනුවට "වැඩිම ඡන්ද සංඛ්‍යාව" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 75අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**57.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තියට ඉක්බිතිවය පහත අලුත් වගන්තිය මෙයින් ඇතුලත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 76අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 76අ වන අලුත් වගන්තිය ඇතුලත් කිරීම.

"කොමසාරිස් වරයා විසින් විධාන නිකුත් කිරීම.

76අ. මෙම ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී ඡන්ද විමසීමක් පැවැත්වීමේ දී යම් දුෂ්කරතාවයක් පැන නගින අවස්ථාවක යම් විශේෂ හෝ කලින් අපේක්ෂා නොකළ අවස්ථාගත කරුණු හෝ මෙම ආඥාපනත මඟින් විධිවිධාන සලස්වා නොමැති කරුණු පිළිබඳව තීරණය කිරීම හෝ වෙනස් කිරීමක් සිදුකිරීම සඳහා යම් ප්‍රශ්නයක් හෝ කාරණයක් තීරණය කිරීම හෝ වෙනස් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීමේ අරමුණින් අවශ්‍ය යයි සලකනු ලබන විධාන, කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් නිකුත් කළ හැකි ය."

**58.** 1990 අංක 25 දරන පනතින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් "තේරීම්භාර නිලධරයකුට භාරදෙන" යන වචන වෙනුවට "26 වන

වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන දැන්වීමේ නිශ්චිතව නම සඳහන් කර ඇති සහකාර තේරීම්භාර නිලධරයාට භාරදෙන" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම උපවගන්තියේ (අඅ) ඡේදය ඉවත් කිරීමෙන්.

**59.** ප්‍රධාන ප්‍රඥප්තියේ 81අ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 81අ වගන්තිය සංශෝධනය කිරීම.

"(ඇ) යම් ඡන්ද දායකයකු විසින් යම් අපේක්ෂකයකුට හෝ යම් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමක් වෙනුවෙන් ඡන්දය පාවිච්චි නොකරන ලෙස පෙළඹ වීම;"

60. ප්‍රධාන ප්‍රඥප්තියේ 81ආ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ ප්‍රධාන ප්‍රඥප්තියේ 81ආ වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුලත් කිරීමෙන් :-

"(1අ) මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක නාමයෝජනා කාලසීමාවේ පළමු දිනයෙන් ආරම්භ වන හා එම ඡන්ද විමසීමේදී ඡන්දය දෙනු ලබන දිනයට ඉක්බිතිවම වූ දිනයෙන් අවසාන වන කාලසීමාව තුළ :-

(අ) බලයේ සිටින දේශපාලන පක්ෂයෙන් තරග කරන යම් නිශ්චිත අපේක්ෂකයකුගේ වාසියට ඡන්දය දීමට ඡන්ද දායකයන්ට බලපෑමක් ඇතිවිය හැකි යම් ආණ්ඩුවේ ආයතනයක් හෝ රාජ්‍ය ව්‍යාපාරයක් තුල අවශ්‍ය නොවන පත්වීම් ලබාදීම, නොකළ යුතු ය ;

(ආ) ඡන්දය දීම පැවැත්වෙන අතරතුර හෝ ඡන්දය ගණන් කරනු ලබන අවස්ථාවේ දී කිසිදු අමාත්‍යවරයකු හෝ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ යම් අමාත්‍යවරයෙකු විසින් ඡන්ද දායකයකු වශයෙන් හැර කිසිදු ඡන්ද පොළකට ඇතුලු නොවිය යුතු ය.";

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ “(1) වන උපවගන්තියේ විධිවිධාන වලින්” යන වචන වෙනුවට “(1) වන හෝ (1අ) උපවගන්ති වල විධිවිධාන වලින්” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එම වගන්තියේ (5) වන උපවගන්තියේ “(1) වන උපවගන්තියේ විධිවිධාන” යන වචන වෙනුවට “(1) හෝ (1අ) උපවගන්තිවල විධිවිධාන” යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තිය සංශෝධනය කිරීම.

61. ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තිය එහි සඳහන් “එකම ඡන්ද විමසීමේ ප්‍රදේශයේ දී” යන වචන වෙනුවට “එකම ඡන්ද විමසීමේ ප්‍රදේශයේ එකම කොට්ඨාශයේ දී” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 82ඈ වගන්තිය සංශෝධනය කිරීම

62. ප්‍රධාන ප්‍රඥප්තියේ 82ඈ වගන්තියේ (2), (3) සහ (4) වන උපවගන්ති, එම උපවගන්තිවල “යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට” යන වචන වෙනුවට, එම වචන යෙදී ඇති සෑම අවස්ථාවක දීම “යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 82ඈ වගන්තිය සංශෝධනය කිරීම.

63. ප්‍රධාන ප්‍රඥප්තියේ 82ඈ වගන්තිය එහි (ඌ) ඡේදයේ සඳහන් “යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට” යන වචන වෙනුවට, එම ඡේදයේ එම වචන යෙදී ඇති සෑම අවස්ථාවක දීම “යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකු” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 82ච වගන්තිය සංශෝධනය කිරීම.

64. ප්‍රධාන ප්‍රඥප්තියේ 82ච වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) “යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සඳහා වූ” යන වචන වෙනුවට “යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් කොට්ඨාශයක් සඳහා වූ” යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම උපවගන්තියේ (අ) ඡේදයේ "ඔවුන් වඩාත් කැමැත්ත දැක්වූ පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට" යන වචන වෙනුවට "ඔවුන් වඩා කැමැත්ත දැක්වූ පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයාට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 82ජ වගන්තිය සංශෝධනය කිරීම.

65. ප්‍රධාන ප්‍රඥප්තියේ 82ජ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර එහි සඳහන් "යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සඳහා මේ ආඥාපනත යටතේ පවත්වන ලද ඡන්ද විමසීමකට අදාළ ඡන්ද පෙත්සමක්" යන වචන වෙනුවට "යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් කොට්ඨාශයක් සඳහා මේ ආඥාපනත යටතේ පවත්වන ලද ඡන්ද විමසීමකට අදාළ ඡන්ද පෙත්සමක්" යන වචන ආදේශ කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 82ට වන වගන්තිය සංශෝධනය කිරීම.

66. ප්‍රධාන ප්‍රඥප්තියේ 82ට වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (අ) ඡේදයේ "ඒ ඡන්ද විමසීමේදී තේරී පත් වූ" යන වචන වෙනුවට "ඒ ඡන්ද විමසීමේදී යම් කොට්ඨාශයක් සඳහා තේරී පත් වූ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම උපවගන්තියේ (ආ) ඡේදයේ "ඒ ඡන්ද විමසීමේදී අපේක්ෂකයකු" යන වචන වෙනුවට "ඒ ඡන්ද විමසීමේදී යම් කොට්ඨාශයක් සඳහා අපේක්ෂකයකු" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 82ඩ වගන්තිය සංශෝධනය කිරීම.

67. ප්‍රධාන ප්‍රඥප්තියේ 82ඩ වගන්තියේ (අ) වන ඡේදය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, එහි සඳහන් "යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් හා සම්බන්ධ" යන වචන වෙනුවට "යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් කොට්ඨාශයක් හා සම්බන්ධ" යන වචන ආදේශ කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 82ත වගන්තිය සංශෝධනය කිරීම.

68. ප්‍රධාන ප්‍රඥප්තියේ 82ත වගන්තියේ (ඉ) ඡේදය මෙයින් සංශෝධනය කරනු ලබන අතර එහි සඳහන් "යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සඳහා වූ" යන වචන වෙනුවට "යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් කොට්ඨාශයක් සඳහා වූ" යන වචන ආදේශ කරනු ලැබේ.

69. ප්‍රධාන ප්‍රඥප්තියේ 82අඈ වගන්තියේ (ඇ) ඡේදය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, එහි සඳහන් “යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් වූ ඡන්ද විමසීම් බලරහිත යයි ප්‍රකාශ කල යුතු බව” යන වචන වෙනුවට “යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් කොට්ඨාශයක් සම්බන්ධයෙන් වූ ඡන්ද විමසීම බලරහිත යයි ප්‍රකාශ කල යුතු බව” යන වචන ආදේශ කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 82අඈ වගන්තිය සංශෝධනය කිරීම.

70. ප්‍රධාන ප්‍රඥප්තියේ 82අළ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 82අළ වගන්තිය ඉවත් කිරීම.

“අනාවරණය කිරීමට එරෙහි තහනම්

82අළ. යම් ඡන්ද විමසීමක දී ඡන්දය දෙන කිසිදු ඡන්දදායකයකු හට එම ඡන්ද විමසීම ප්‍රශ්න කරනු ලබන යම් නඩු කටයුත්තක දී ඔහු ඡන්දය දෙනු ලැබුවේ කවර අපේක්ෂකයකුටද යන්න ප්‍රකාශ කිරීම සඳහා නියම නොකළ යුතු ය.”

71. ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය එහි “යම් ඡන්ද විමසීම් ප්‍රදේශයකට අයත් ඡන්ද හිමි නාමලේඛන” යන වචන වෙනුවට “යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක එක් එක් කොට්ඨාශයකට අයත් ඡන්දහිමි නාමලේඛනය” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය සංශෝධනය කිරීම.

72. ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

“ඡන්ද විමසීම් වල වියදම්.

86. යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක එක් එක් කොට්ඨාශයක ඡන්ද හිමි නාමලේඛනය පිළියෙල කිරීමේ දී ද, යම් පළාත් පාලන ආයතනයක යම් ඡන්ද විමසීමක කාර්යය සඳහා අපේක්ෂකයන් නම් කිරීම සම්බන්ධයෙන් ද, මේ ආඥාපනත යටතේ දරන ලද සියලු වියදම් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.”

73. 1990 අංක 25 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) "නියමිත දිනය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය එකතු කිරීමෙන්:-

"අනුමත ලකුණ" යන්නෙන් කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් මෙම ආඥාපනතේ කාර්යය සඳහා අනුමත කරන ලද ලකුණක් අදහස් වේ,";

(2) "බලයලත් නියෝජිතයා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන්; සහ

(3) "මැතිවරණ කොමසාරිස්වරයා" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුලත් කිරීමෙන් :-

"සභාව" යන්නෙන් අවස්ථාවෝචිත පරිදි මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වේ.".

74. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය මෙයින් ඉවත්කර ඒ වෙනුවට පහත උපලේඛනය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම

**පළමුවන උපලේඛනය** (28(2) වන වගන්තිය)

නාමයෝජනා ආකෘති පත්‍රය

............................................. සභාව/ප්‍රාදේශීය සභාව

පිළිගත් දේශපාලන පක්ෂයක්/ස්වාධීන කණ්ඩායමක් වන ..................... පක්ෂය විසින් (ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට) ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂක කණ්ඩායමේ නායකයා වන ............... විසින් ................................... මහනගර සභාවේ/නගරසභාවේ/ප්‍රාදේශීය සභාවේ සමාජිකයන් තෝරාගැනිම සඳහා අපේක්ෂකයන් වශයෙන් පහත දැක්වෙන තැනැත්තන් මෙයින් නාමයෝජනා කරනු ලැබේ.

**I වන කණ්ඩායමේ - අපේක්ෂකයන්**

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|
| කොට්ඨාශයේ නම සහ අංකය† | නම සහ ජාතික හැඳුනුම්පත් අංකය | ලිපිනය | රැකියාව | කාන්තා (W) තරුණ (Y) එකඟත්වය පෙන්නුම් කිරීම සඳහා තබන අත්සන | ඡන්ද දිස්ත්‍රික් අංකය සහ අපේක්ෂකයාගේ අනුකමික අංකය | අපේක්ෂක-යාගේ කැමැත්ත පෙන්නුම් කිරීම සඳහා තබන අත්සන |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

**II අමතර - තැනැත්තන්**

| 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|
| නම සහ ජාතික හැඳුනුම්පත් අංකය | ලිපිනය | රැකියාව | කාන්තා (W) තරුණ (Y) එකඟත්වය පෙන්නුම් කිරීම සඳහා තබන අත්සන | ඡන්ද දිස්ත්‍රික් අංකය සහ අමතර තැනැත්තන්ගේ අනුකමික අංකය | අමතර තැනැත්තන්ගේ කැමැත්ත පෙන්නුම් කිරීම සඳහා තබන අත්සන |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

† කොට්ඨාශය බහු සභික කොට්ඨාශයක් ද ඒ බව සඳහන් කර, සභිකයන් දෙදෙනෙකු තෝරාපත් කරගැනීමේ දී තරු සළකුණු එකකින් ද (*) සභිකයන් තිදෙනෙකු තෝරාපත් කරගැනීමේදී තරු සලකුණු දෙකකින් ද, (**) පෙන්නුම් කරන්න.

මෙම නාමයෝජනා පත්‍රයෙහි නම් සඳහන් සියලු තරුණ අපේක්ෂකයන් ආඥාපනතේ 89 වන වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති වයස් සීමාව තුළ සිටින බවට මා මෙයින් සහතික කරමි.

පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ගේ/ කණ්ඩායම් නායකයාගේ අත්සන

නම : ..........................................................

ලිපිනය : ......................................................

ඉහත නම් සඳහන් ................................... යන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්/කණ්ඩායම් නායක විසින් 2010.........මස ............ දින මා ඉදිරිපිටදී අත්සන් කරන ලදී.

75. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත උපලේඛනය ආදේශ කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

**"දෙවන උපලේඛනය** (45 වන වගන්තිය)

ඡන්ද දීමෙහිලා ඡන්දදායකයාට මග පෙන්වීම සඳහා සෑම ඡන්ද පොළකම පිටපතින් හා ඡන්දය දෙන සෑම ආවෘත ස්ථානයකම ප්‍රදර්ශනය කළ යුතු විධානවල ආකෘතිය.

සෑම ඡන්දදායකයකුටම තම කැමැත්ත පරිදි යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට ලබාදිය හැකි එක ඡන්දයක් තිබිය යුතු ය.

ඡන්දදායකයා. ඡන්දය දෙන එක් ආවෘති ස්ථානයකට ගොස්, ඡන්ද පත්‍රිකාවේ දකුණු පැත්තතේ අවස්ථාවෝචිත පරිදි තමා ඡන්දය දෙන පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ ලකුණ ඉදිරියේ මෙසේ (**x**) කතිරයක් ලකුණු කළ යුතු ය.

ඉනික්බිතිව ඡන්ද පත්‍රිකාවේ පිට පැත්තතේ නිල ලකුණ ඡන්ද ස්ථානාධිපතිවරයාට පෙනෙන පරිදි ඡන්ද පත්‍රිකාව නමා එය ඡන්ද පෙට්ටිය තුළ බහා ඡන්ද පොළෙන් වහාම ඉවත්ව යා යුතු ය.

ඡන්දදායකයා අතින් වූ ප්‍රමාද දෝෂයකින් ඡන්ද පත්‍රිකාවක් නරක් වුවහොත්, ඔහු විසින් ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත එය ආපසු දිය හැකි අතර, ඡන්ද ස්ථානාධිපතිවරයා එය ප්‍රමාද දෝෂයක් බවට සෑහීමට පත්වන්නේ නම් ඔහුට වෙනත් ඡන්ද පත්‍රිකාවක් දිය හැකිය.

ඡන්දදායකයා විසින් :-

(අ) එක් අපේක්ෂකයකුට වඩා වැඩි ගණනකට ඡන්දය දෙනු ලැබුව හොත් හෝ

(ආ) තමාට පසුව හඳුනාගත හැකි වන යම් ලකුණක් පත්‍රිකාවෙහි සටහන් කළ හොත්,

ඔහුගේ ඡන්ද පත්‍රිකාව අවලංගු වන අතර, එය ගණන් කරනු නොලැබේ. ඡන්දදායකයා, ඡන්ද පොළකින් පිටත ඡන්ද පත්‍රිකාවක් ගෙන යන්නේ නම් හෝ ඡන්ද පෙට්ටිය තුළට දැමීමට තමාට බලය දෙන ලද ඡන්ද පත්‍රිකාවක් නොවන යම් දෙයක් එම පෙට්ටිය තුළට බහාලන්නේ නම් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

**76.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛණය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

**"තුන්වන උපලේඛනය** (47 වන වගන්තිය)

ඡන්ද පත්‍රිකාවේ මුහුණතෙහි ආකෘතිය

උපපත්‍රිකාවේ අංකය :

| | | |
|---|---|---|
| "ඒ" පක්ෂය | - | ඡන්ද සලකුණ |
| "බී" පක්ෂය | - | ඡන්ද සලකුණ |
| "සී" පක්ෂය | - | ඡන්ද සලකුණ |
| ස්වාධීන කණ්ඩායම 1 | - | ඡන්ද සලකුණ |
| ස්වාධීන කණ්ඩායම 2 | - | ඡන්ද සලකුණ |
| ස්වාධීන කණ්ඩායම 3 | - | ඡන්ද සලකුණ |

**77.** ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය මෙයින් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම්

**"හතරවන උපලේඛනය** (76 (1) වන වගන්තිය)

රහස්‍යතා ප්‍රකාශයේ ආකෘතිය

.........................................වන මම ................................ මහ නගර සභාවේ/නගර සභාවේ/ප්‍රාදේශීය සභාවේ ඡන්ද විමසීම ප්‍රදේශයේ ................................ කොට්ඨාශය සඳහා පැවැත්වෙන මේ ඡන්ද විමසීදී මා හට කියවා දෙන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 76 වන වගන්තියෙන් තහනම් කෙරෙන කිසිවක් නොකරන බව ගම්භීරතා පූර්වකව පොරොන්දු වී ප්‍රකාශ කරමි.

| | |
|---|---|
| ...................................... | ........................... |
| ප්‍රකාශය ගනු ලබන තැනැත්තාගේ නම හා තනතුර | ප්‍රකාශකගේ අත්සන |

*සැලකිය යුතුය* :- ප්‍රකාශය ගනු ලබන තැනැත්තා විසින්, මේ වගන්තිය ප්‍රකාශකට කියවා දෙනු ලැබිය යුතු ය.

**78.** ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

**හත්වන උපලේඛනය** (53අ වන වගන්තිය)

නාමලේඛනයේ ආකෘතිය

ඡන්ද පත්‍රිකා භාර දෙනු නොලැබූ ඡන්දදායකයන්ගේ නාමලේඛනය

පළාත් පාලන ආයතනය : .........................................

කොට්ඨාශ අංකය : .........................................

ඡන්ද විමසීමේ දිනය : .........................................

ඡන්ද පොළ : .........................................

| ඡන්දහිමි නාම ලේඛනයෙහි ඇති අංකය | ඡන්ද දායකයාගේ නම | ඡන්ද දායකයාගේ ලිපිනය | ඡන්ද පත්‍රිකාව භාර නොදීමට හේතුව | | | |
|---|---|---|---|---|---|---|
| | | | උචිත පරීක්ෂණය කිරීමට ඉඩ නොදීම | උචිත ලකුණින් එවකටත් ලකුණු කොට තිබීම | උචිත ලකුණින් ලකුණු කරනු ලැබීම ප්‍රතික්ෂේප කිරීම | වලංගු අනන්‍යතා ලේඛනයක් හෝ අනන්‍යතාව තහවුරු නොකිරීම |
| | | | | | | |

**79.** ප්‍රධාන ප්‍රඥප්තියේ අටවන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ අටවන උපලේඛනය ඉවත් කිරීම.

**80.** මෙම පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

අර්ථ නිරූපනණය සහ ඉවත් කිරීම.

81. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා සහ ඡන්ද විමසීම් නිලධරයා යනුවෙන් දක්වා ඇති සෑම සඳහනක් ම අදාළ ඡන්ද විමසීම් ප්‍රදේශය පිහිටා ඇති දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත්කරනු ලැබූ දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයා වශයෙන් කියවිය යුතු හා තේරුම්ගත යුතු ය.

(2) 1987 අංක 24 දරණ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධිත) පනතේ 34 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.